# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.
# මහා සභා රැස්වීම් වාර්තාව.
# 2019.02.18

වර්ෂ 2019 ක් වූ පෙබරවාරි මස 18 වැනි දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ පෙබරවාරි මස මහා සභා රැස්වීම් වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද  මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රිනී ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රිනී පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව සභා ලේකම් අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.</u>**

01. 2019.01.17 දින පැවති රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.01.17 දින පැවති මහා සභා වාර්තාව කියෙවුවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2019.01.17 දින පැවති මහා සභා වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, 2019.01.17 දින පැවති මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීමට යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අඩුපාඩුකම් තියේ නම් පෙන්වලා දෙන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට තේරෙන දේ තමයි සභාපතිතුමා, වාර්තාව බලලා නෑ. මම අනවශ්‍ය දෙයක් මේ කරන්නේ. ඔබතුමා කතා කරපු දෙයක්.

6 පිටුව

- " ඊට පස්සේ පරිසර සුරකීම් සංවිධානය මගින් නඩුවක් ගොනු කරලා තිබුණා" එක " ඊට පස්සේ පාසල් සුරකීම් සංවිධානය මගින් නඩුවක් ගොනු කරලා තිබුණා" ලෙස සංශෝධනය විය යුතුයි.

8 පිටුව

- "මම ආරාධනා කරනවා මම උදව් කරන අයට " එක "මම ආරාධනා කරනවා මට උදව් කරන අයට" ලෙස සංශෝධනය විය යුතුයි.

11 පිටුව

- "අබේසේකර මන්ත්‍රීතුමා ඉදපු සභාවල එතුමා යෝජනා කරේ."

මම එහෙම යෝජනා කරේ නෑ. මේක ආවහම බොහෝ නරක චෝදනාවක් එන්නේ. මම එහෙම යෝජනාවක් කරේ නෑ. ඔබතුමා කියලා තියෙනවා ප්‍රතිපාදන පිළිබඳව කතා කරගෙන යන කොට අබේසේකර මන්ත්‍රීතුමා තමයි යෝජනා කරේ ප්‍රතිපාදන විපක්ෂයට දෙන්න එපා කියලා.

(ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිවුවේ මේ සභාවේ නෙමෙයි කලින් සභාවල.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පුළුවන් නම් පෙන්වන්න. මම යෝජනා කරලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කණ්ඩායම තුළ මතු කරපු පොදු තීරණ තියෙනවනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම එහෙම යෝජනා කරලා නෑ. ඕක සඳහන් වෙන්න ඕන විශේෂයෙන්.

19 පිටුව

- " මේක එන්නේ ගරු සභාපතිතුමා වක්වැල්ලේ අනවසර තාප්ප ප්‍රශ්නය. මෙතනදී මම පැහැදිලිව අදහස් දැක්වූවා. ඒක සඳහන් වෙලා නෑ. ඒකයි මට ඕන. මම සඳහන් කරා බොහොම පැහැදිලිවම. ඒක වැරැද්දක්. නීතියෙනුත් බොහොම පැහැදිලිවම ඉඩක් තියෙනවා මරණයක් පාරක ගෙනිච්චා නම් ඒක පොදු පාරක් කියලා. ඒක තමයි මිනිස්සු පෞද්ගලික ඉඩමකින් මරණයක් ගෙනියන්න දෙන්නෙ නැති තත්වයකට ඇවිත් තියෙන්නේ. එතන සඳහන් වීමක් වෙන්න ඕන මම කියපු එක.

40 පිටුව

- " ඕපාත හග්ගොඩදූව පාර සංවර්ධනය කිරීම"

මම ඉන්න කොට්ඨාශය. මම හරි කැමතියි. මගේ කොට්ඨාශයේ පාරක් කරනවා නම්, හෙට දවසෙත් ඕනෑම පාරක් හදන්න. හැබැයි මේකත් කියන්න ඕන. ඒ පාරට ඔබතුමන්ලගේ දේශපාලන නායකත්වය ඉතාම පැහැදිලිව කිවුවා එක අවස්ථාවකදී ශත පහක් මේ කොක්කු යන පාරට වියදම් කරන්න එපා කියලා මට. මට වෙන කෙනෙක් පාරක් දැම්මම කිවුවා ඒක ගෙවල් දෙකකටයි කියලා යන්න තියෙන්නේ. ඒ අය ඒක කියලා ඉවර වෙලා, බොහොම පැහැදිලිව රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා මට පෞද්ගලික ප්‍රතිපාදන වලින් කරන්න දුන්නෙත් නෑ.

ඔබතුමා ඒ දාපු පාර ඉතාම වටිනවා. මේකේදී නීතිමය ප්‍රශ්නයක් එන එකයි මම මතු කරලා කියන්න ගියේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** හග්ගොඩදූව පාරේ අවසාන කොටසටයි මම කොරිපස් දැම්මේ මන්ත්‍රීතුමා. ඔබතුමා තමයි මේ පාර ලක්ෂ 10 කින් සල්ලි වියදම් කරලා පාරේ මුල් ටික කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන වාර්තාවේ අඩුපාඩු ටික ඉස්සර වෙලා ඉවර කරගෙන ඉමුකෝ. පස්සේ ඔයි ප්‍රශ්න විසඳගමු.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වාර්තාවේ අඩුපාඩු එච්චරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තවත් තියෙනවද අඩුපාඩු?. තවත් අඩුපාඩු නැත්නම් සංශෝධන වලට යටත්ව වාර්තාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.01.17 දින පැවති මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ඒකමතිකව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගම්පෙරළිය වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මාර්ග රාශියක යෝජනා ලබා දීලා තියෙනවා. ඒ යෝජනා වල තියෙන මාර්ග පිළිබඳ විස්තර මට ලැබෙන්න සැලැස්සුවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්. නමුත් එතන ප්‍රාදේශීය සභාව මේ වන විට ක්‍රියාත්මක කරන යෝජනා කීපයකුත් තියෙනවා. ඒකෙදී ඒ ටික අතඇරලා ඉතුරු ටික ක්‍රියාත්මක කරන්න කියලා මම කිවුවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලට. එතනදී ඒ යෝජනා ටික ලකුණු කරලා දෙන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දෙන්න. අපෙන් කරන යෝජනා ටිකත් ලකුණු කරලා යවනවා. විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමත් දැන් කතා කරා. සේරියගොඩ පාරෙ තමයි මූලික වශයෙන් ගැටලුවක් තියෙන්නේ. එතනදී එතුමා කිවුවා සභාවෙන් කරන ටික අතඇරලා ඉතුරු ටික කරනවා කියලා. මොකද ලක්ෂ 10 ක මුදලක් සභාවෙන් කරනවා. ගම්පෙරළිය යටතේ ලක්ෂ 10 ක් කරනවා. අපි බලන්න ඕන ලක්ෂ 20ටම වැඩ ටික කරගන්න. අපේ කාර්මික නිලධාරිතුමා එක්ක කතා කරලා අපෙන් කරන වැඩ ටික බලලා ඉතුරු ටිකට ඇස්තමේන්තු සකස් කරන්න ඕන.

සභාව දැනට කරන කර්මාන්ත ටික අතඇරලා ඉතුරු ටික ගම්පෙරළිය වැඩසටහන යටතේ කරන්න. මටත් ඕන වැඩිපුර පාරවල් ටිකක් කරගන්න. මගේ ඔලුවේ තියෙන බර තමයි ටිකෙන් ටික නිදහස් වෙන්නේ. ඒකෙදී උපක්‍රමශීලීව පාරත් සමඟ කාණුව හදන්න එන මුදලින්. ඒක තමයි දැන් තියෙන වර්තමාන තත්වය. අපිට සභාවෙන් කෙරෙන ටික අත අරින්න බෑ. සභාවෙන් කරන ටිකත් කරන්න ඕන. ඒ වගේම තමයි ඇස්තමේන්තු කරන්න පුළුවන් සීමාවන් තියෙනවා.

( ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිට වීම සිදුවිය.)

ඒ වගේම අපේ සභාවට කම්පැක්ටර් ට්‍රක් රථයක් කසල කළමනාකරණ සඳහා ලැබුණා. ඒ පිළිබඳ ගරු පළාත් පාලන අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමාට සභාපතිවරයා විදියටත්, සියලු මන්ත්‍රීවරු විදියටත් ස්තුතිවන්ත වෙනවා. ඒ පිළිබඳ ලිපියක් යවන්න කියලා මම දැනුම් දෙනවා. ඒ වගේම අපිට අත්‍යවශ්‍ය කාරණයක් තියෙනවා කසල කළමනාකරණයට හා ආදාහනාගාරය ඉදිකිරීම සඳහා ඉඩමක් ලබා ගැනීම. ඒකෙදී අපි පහුගිය සභා තීන්දුවක් යවලා තියෙන්නේ. ඒ වගේම ආණ්ඩුකාරතුමා එක්ක පහුගිය දින තිබුණ රැස්වීමේදී ඒක එතුමාටත් ලැබෙන්න සැලැස්සුවා. එතුමා L.R.C. එකේ අධ්‍යක්ෂකතුමාට ඒවෙලේම ලබලා දුන්නා. ඉක්මනට උත්තරයක් දෙන්න කියලා.

වැවිලි කර්මාන්ත අමාත්‍යංශයට දෙන්න කලින් ඕක L.R.C. එකට තිබුණ ඉඩමක්. ඕක 51% ක භාරයට තමයි ඒක දීලා තියෙන්නේ. ඒවෙලේම ආණ්ඩුකාරතුමා ලබා දුන්නා L.R.C එකේ අධ්‍යක්ෂකතුමාට. ආණ්ඩුකාරතුමාගේ පැත්තෙනුත් ඒ වැඩේ යනවා. මම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුගෙන් ඉල්ලා සිටින්නේ අපිට අක්කර 05 ඉඩම ගන්න උදවු කරන්න. මේක තමයි ඒකට හොඳම අවස්ථාව. අබේසේකර මන්ත්‍රීතුමාට ඒ සම්බන්ධ පිටපත් ලබා දීලා තියෙන්නේ. විශේෂ නිවේදන යටතේ එච්චරයි.

රංගනී මන්ත්‍රීතුමියට සේරියගොඩ පාර පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ස්තුතියි ගරු සභාපතිතුමා. සේරියගොඩ පාර සම්බන්ධව කතා කරන කොට සභාපතිතුමාගෙනුත් කලින් කරුණු කාරණා විමසුවේ වෙන කිසිම හේතුවක් නිසා නෙමෙයි, පාරට මුදල් මුලින්ම පාස් වුනේ මගේ යෝජනාවත් එක්ක. 2018 නොවැම්බර් 13 වෙනිදා තමයි සේරියගොඩ පාරට සභාවෙන් ලියුමක් ඉදිරිපත් කරලා තියෙන්නේ. ඒක ලේඛන අරගෙන බැලුවොත් පෙනේවි. මේ පාර අවශ්‍යයි කියන යෝජනාව. ඊළගට මේ පාරට පළාත් කොමසාරිස් කාර්යාලයෙන්, සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් නිර්දේශ ලැබිලා නෑ කියලා ඔප්පු කරලා පෙන්නන්න පුළුවන්. සාක්ෂි තියා ගෙන තමයි සභාපතිතුමා මම කතා කරේ. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් නිර්දේශ කරලා තමයි පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට දන්වන්නේ. එතනදීවත් මේකට නිර්දේශ ලැබිලා නෑ. ලේකම්තුමා මේකට යවලා තියෙන්නේ ලියුමක් 2019.01.05 වෙනිදා. එතකොට පාර ගම්පෙරළිය වැඩසටහනට දාපු කාල වකවානුව තමයි මේක තියෙන්නේ. මේ පාර ඇස්තමේන්තු කරන්න මැන්නේ සභාපතිතුමා 2019 ජනවාරි 04 වෙනදා. මම පාරෙ යද්දී දැකපු ටික තමයි මේ කියන්නේ. ටෙක්ලා මන්ත්‍රීතුමියත් ඕක දැක්කා. ඇතුලත් කරපු දිනය මම දන්නේ නෑ. මම කිවුවේ මනිනවා දැකපු දවස.

ඒ පාර කරනවා නම් TO මහත්තයානේ ඒ පාර මනින්නේ. ඒ පාර වෙන හේතුවකට මනින්න නෑනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඔබතුමියට ඕන නම් කියන්නම්. ඒ පාර මැන්නේ නෑ. පළාත් පාලනයට යවන්න ඕන ලක්ෂ 05 ට වැඩි කර්මාන්ත. යැවුවට පස්සේ පළාත් පාලන ඉංජිනේරු පරීක්ෂා කරනවා. ඔබතුමිය කියන්නේ ඒක.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම කියන්නේ ඒක වෙන්න පුළුවන්. TO මහත්තයා එක්ක මම කතා කරලා ගියේ. මම කිවුවේ පාර මැන්නා කියලා විතරයි. නමුත් ගාල්ල දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයෙන් මේ සම්බන්ධව ලේඛනයක් ලැබිලා නෑ. මම කියන්නේ පෙරේදා දවස වෙනකම් ප්‍රාදේශීය සභාවට එහෙම ලියුමක් ලැබිලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇස්තමේන්තු අනුමත කරලා තියෙන්නේ 2018.09.10

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මැන්නේ මොන හේතුවකටද කියලා මම දන්නේ නෑ. මනිනවා දැක්කා කියලා විතරයි මම කිවුවේ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔයා පෙරේදා ඇවිල්ලා ෆයිල් එක බැලුවනේ. එතකොට මේ ඇස්තමේන්තුව දැක්කේ නැද්ද?.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මේ සභාවට දාලා අනුමත කරලා නෑනේ ඔය ඇස්තමේන්තුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනගෙන නෙමෙයිනේ කතා කරන්නේ.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සේරියගොඩ පාරට ඇස්තමේන්තුවක්වත් අනුමත කරන්න කිසිම සභාවක කතා කරේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමියගේ දැනුවත්භාවය පිළිබඳ අපිට කරන්න දෙයක් නෑ.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභා වාර්තාවල නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමිය එහෙම පුළුවන්ද සභා තීන්දුවක් නැතිව කර්මාන්තයක් කරන්න.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම සියලුම සභා වාර්තා පරීක්ෂා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කර්මාන්ත කමිටු වල තියෙනවා.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඕකේ ඇස්තමේන්තුව දාලා නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කමිටු තීන්දු ටික දානවා සභාවට.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** පළාත් පාලන දෙපාර්තමේන්තුව දීපු ලිපිය දෙන්න මට. එතකොට මේ කතාව අවසන් කරන්න පුළුවන් අපිට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ලිපියක් දෙන්නේ නෑ. ඇස්තමේන්තු සහතික කරනවා ඉංජිනේරුතුමා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2018.09.10 දින පැවති කර්මාන්ත කමිටුවේදී ඒක සම්මත කරලා තියෙනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම කියන්නේ මෙහෙමයි. මේකට ගම්පෙරළියෙනුත් ක්‍රියාත්මක වෙනවා. සභාවෙනුත් ක්‍රියාත්මක වෙනවා. අපිට පුළුවන් සභාවේ යෝජනා ඕන විදියකට වෙනස් කර ගන්න. ගම්පෙරළිය වැඩසටහනට යෝජනා වෙනස් කරන්න ගියාම මුදල් අමාත්‍යාංශයට ගිහිල්ලා මාස ගාණක් යනවා. ඒක හරි නොයන්න පුළුවන්. සංශෝධනයකට යන්න ගියාම මාස හතරක් යනවා. ඒක නිසා සානුකම්පිතව කියන්නේ ගම්පෙරළිය වැඩසටහනේ ටික කරන්න දෙන්න. තව පාරවල් තියෙනවනේ. මට මගේ ගම් ප්‍රදේශයේ යෝජනා 03 ක් දාලා ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න බැරි වුනා. අපි කවුරුත් බල ප්‍රදේශයට වැඩ කරන්න ඕන. අපි සාමූහිකව ජනතාවට සේවය කරමු. පාර එයා කරත් මෙයා කරත් ප්‍රශ්නයක් නෑ. වක්වැල්ල කොට්ඨාශයට රංගනී මන්ත්‍රීතුමිය විශාල වැඩ කොටසක් කරා. ඒත් එතුමිය ඡන්දය පරාදයි. වැඩ කරා කියලා මිනිස්සු ඡන්දෙ දෙන්නේ නෑ. වැලිපිටිමෝදර කොට්ඨාශයට කෝටි ගානක වැඩ කරා අමිල නුවන් හිටපු මන්ත්‍රීතුමා. ඒත් ඡන්දය පරාදයි. පාරවල් කරා කියලා මිනිස්සු ඡන්දෙ දෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා. ඒක සංශෝධන කරන්න දෙයක් නෑ. සේරියගොඩ පාරේ අපි කරන ටිකේ ඉතුරු ටික කරොත් ලක්ෂ 10 කින් ඒක කරන්න බෑ. විජේපාල මන්ත්‍රීතුමා කිවුවෙත් ඒක. සභාවෙන් කරන ටික ලකුණු කරලා දෙන්න. ඉතුරු ටික කරන්නම් කියලා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** පාරේ මුල් ටික මම ඇස්තමේන්තු කරේ. මම ඒ ටික කරාම ඔබතුමා ඉතුරු ටික කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට බෑ. පළාත් පාලන ඉංජිනේරුතුමා අඩියෙන් අඩියට මැනලා ඇස්තමේන්තු හැදුවට පස්සේ අපිට වෙන තැනක් හදන්න බෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභාවක් මම යෝජනා කරනවා සේරියගොඩ පාර සම්බන්ධ තාක්ෂණ නිලධාරිතුමාට අදහස් දක්වන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**කාරක සභා අවස්ථාව**

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි ඒ. ජී. පී. එස්. ගුණසේකර මයා පහත අදහස් දක්වන ලදි.

- පළාත් පාලන ඉංජිනේරුතුමා සේරියගොඩ පාර සම්බන්ධව ලබා දුන් නිර්දේශ
- සේරියගොඩ පාරට අඩුපාඩුවකට ඇති පැති කාණුව සකස් කල යුතු බව

- ඇස්තමේන්තු සකස් කිරීම සිදු කරේ වක්වැල්ල පිවිසුමේ සිට බව
- පාරේ කැඩුණු තැන් සියල්ල අලුත්වැඩියා කරන බව
- පාර අලුත්වැඩියා කරන ආකාරය පිළිබඳ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කාරක සභාව අවසන් කිරීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- ඔබතුමා වක්වැල්ල පැත්තෙ ඉදන් කරන්න. මේ පාර මැන්නේ අනිත් පැත්තෙන් මම ඒ ටික කරන්නම්.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මුලු පාරෙම වලවල් ටික වහනවා.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- මට මුලින් පාස් වුන මුදලින් මේක කරන්න අරින්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- සභාවෙන් කරන්නේ පාරේ වලවල් ටික අළුත්වැඩියා කරන එකනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කිලෝමීටරයකට පැච් ටික වැහෙනවා. මීටර් 580 ක සෙකන්ඩ් කෝඩ් එකක් ගහනවා. පාර කඩන්න නම් දෙන්නේ නෑ. හොඳට තියෙන පාර කඩන්න දෙන්න බෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- ඔබතුමා මේකේ මේ විදියට වැඩ කරන්න එපා. අපි පාර හදනකොට පාර කඩලා සම්පූර්ණයෙන් ආයේ හදනවා. පැච් ටික දාලා සෙකන්ඩ් කෝඩ් දැම්මට පාර කැඩෙනවා. ඒ නිසා ගම්පෙරළිය වැඩසටහන යටතේ පාරවල් හදන කොට සම්පූර්ණයෙන් පාර කඩලා හදනවා. එතකොට ඒ පාර අවුරුදු ගාණක් පවතිනවා. මෙතුමිය මැනලා තියෙන්නේ පල්ලියගුරු මහත්තයලගේ ගෙවල් පැත්තේ. ඒ පැත්තේ ඉදන් ලක්ෂ 10 ට ලොකු දුරක් පාර හදන්න බෑ. ඒ ටික මෙතුමියට කරන්න දීලා ඉතුරු ටික ඔබතුමා සභාවෙන් කරන්න. එතකොට ප්‍රශ්නය විසඳෙනවා. මේක මහ ලොකු ප්‍රශ්නයක් නෙමෙයි. අනුමැතිය ගන්න කොට එතුමිය කරන ටික අත ඇරලා ඉතුරු ටික කරන්න. එතකොට පාර තව හොඳට හඳන්න පුළුවන්. කිලෝමීටර එකහමාරක් ලක්ෂ 20 කින් හදනවා කියන එකත් ලොකු දෙයක්. කවුරු කරත් එකයිනේ. එතකොට මේ ප්‍රශ්නය විසඳෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- හොඳට තියෙන පාර කඩන්න දෙන්න බෑ. වතුර රැඳෙන තැන් කීපයක වලවල් කීපයක් තියෙනවා. නැත්නම් පාර හොඳටම තියෙනවා. ඔබතුමා ගිහින් බලන්න. නැත්නම් සභාව ඉවර වෙලා යමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- මම ඒ පාරේ ගිහින් තියෙනවා. ඒ පාර ටිකක් උස්සලා හදන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපේ ඇස්තමේන්තුවේ බෝක්කුවක් හදලා උස්සන්න තියෙනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැන් තියෙන්නේ එක විසඳුමයි. අපි පාර කරන ටික බලලා ඉතුරු ටික ඇස්තමේන්තු කරලා කරන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- මේ පාරට මුදල් පාස් වෙලා හෙට කරන්න පුළුවන් මට්ටමේ තියෙන පාරක්. සභාවේ මුදල් යොදවන්න වෙන පාරක් නැද්ද මේ කොට්ඨාශයේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමියගේ ලක්ෂ 10 යි. අපේ ලක්ෂ 10 යි. ඒකයි. විශේෂතාව මොකද්ද කියන්නේ ඔබතුමයගේ ලක්ෂ 10.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මට සල්ලි පාස් වෙලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපෙන් වෙන් කරලා තියෙන්නේ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ පාරක් ඕක. ප්‍රාදේශීය ලේකම් එකේ පාරක් නෙමෙයි.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවෙන් කරන ලක්ෂ 10න් පාර කරනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මටත් මේ වගේ ප්‍රශ්නයක් පැන නගිනවා. ඇලබඩ පොල් කොරටුව පාර ගංවතුරට යටවෙලා පාර බැහැලා තිබුණා. සභාපතිතුමත් දකින්න ඇති. අපි ඒකට මට ලැබුණු මුදල් වලින් ABC ගල් දාලා අඩි 02 ක් විතර උස්සලා හැදුවා. දැන් පාරෙ යන්න බෑ. මම පහුගිය දිනක මහ ඇමතිතුමා හම්බුනාම ලක්ෂ 10 ක් දෙන්නම් කිව්වා පාරට. ඊට පස්සේ ඒ කීමට ගියා TO මහත්තයා, ඉංජිනේරුතුමයි, මමයි ගිහින් ඒ පාර බැලුවා. ඒ පාර ගිලා බහින පාරක් බද්දෙගම පාර වගේ. ඒ හින්දා ඉංජිනේරුතුමා දුන්නා ප්ලෑන් එකක්. ඒක අනුව කරන්න කිව්වා කම්බි දාලා කොන්ක්‍රීට් කරලා මේ ලක්ෂ දහය දැන් මදි. මම දැක්කා ගම්පෙරළිය වැඩ සටහන යටතේ ඒ පාරේ කොටසක් දාලා තියෙනවා. අපිට ඒකට ගැටලුවක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෙකම එකතු කරලා කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක කරන කොට අපේ පළාත් පාලනේ ඉංජිනේරු මහත්මයා කිව්වා විදියට ඉතුරු කොටසත් ඒ විදියටම කරන්න ඕන. මම සභාවේ අවධානය යොමු කරනවා මේ පාරවල් කරන කොට, අවදානම් තියෙන පාරවල් කරන කොට පලාත් පාලන ඉංජිනේරුතුමාගේ අනුමැතිය අරන් හදන්න ඕන. ඒ වගේම තමයි සභා බල ප්‍රදේශයේ තියෙන සභා පාරවල් හදනකොට පක්ෂ විපක්ෂ කවුරු වුනත් සභාවේ අවසර ගන්න ඕන. එම නිසා ඒ කරුණු වලට අවධානය යොමු කරන්න කියලා මම කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද පත්තරේ තියෙනවා ජනාධිපතිතුමා කියලා තියෙන්නේ රජයේ සේවකයන් පඩි පවා ගන්න මුදල් නෑ කියලා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විජේපාල මන්ත්‍රීතුමා කතා කරලා කිවුවේ සභාවෙන් කරන ටික කරන්න. ඉතුරු ටිකට මේ ලක්ෂ 10 න් කරමු කියලා.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මේ පාර කොටස් 02 ක් දෙපැත්තෙන් කරනවා. මේ පැත්තට ලක්ෂ 10 යි. අර පැත්තට ලක්ෂ 10 යි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට මැද ඉතුරු කරනවා. මේ පැත්තට ලක්ෂ 10 යි දාලා මැද ඉතුරු කරන්න දෙන්න බෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉංජිනේරුතුමා ඒ පාර අඩියෙන් අඩිය කිලෝමීටර් එකහමාරට සම්පූර්ණයෙන් කරන්න ඕන ටික කරලා තමයි මීටර් 580 ක් සෙකන්ඩ් කෝඩ් ගහන්නේ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේ ප්‍රශ්නය පිළිබඳව විශේෂ අවධානය යොමු කරවන්න. මේක තරහෙන් විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නෙමෙයි. ගම්පෙරළිය වැඩසටහන පොදුවේ රට පුරා ක්‍රියාත්මක වෙන වැඩ සටහනක් සභාපතිතුමා. මේ සභාවේ මුදල් අපිට වෙන පාරකට යොදවන්න පුළුවන්. මේ සියල්ල කරන්නේ බල ප්‍රදේශයට. ඒ නිසා අවධානය යොමු කරන්න ඔබතුමා අපි රණ්ඩු කරන්න ඕන නෑ මේකට. සේරියගොඩ පාරේ ඉතුරු ටිකට අපි කාගේ හරි ප්‍රතිපාදන දාලා, නැත්නම් මහ ඇමතිතුමාගෙන් ඉල්ලගෙන හරි කරමු.

මම කියන්නේ ගම්පෙරළියට මුල් තැන දෙන්න. වෙන දෙයක් නෙමෙයි. ඒක කොළඹ ගිහිල්ලා අරහේ මෙහේ ගිහිල්ලා එන්න ඕන. මට වුනා ඕක. ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා ගම්පෙරළිය වැඩසටහනට ප්‍රමුඛතාවය දෙන්න. අපේ බල ප්‍රදේශයේනේ වැඩ කරන්නේ.

(ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මීටර් 580ක් අපි කරනවා. එතකොට තව කිලෝමීටරයකට අඩු ප්‍රමාණයක් ඉතුරු වෙනවා සෙකන්ඩ් කෝඩ් එකට. ඉතුරු සෙකන්ඩ් කෝඩ් එකට ඇස්තමේන්තුව හදලා සල්ලි තව තියේ නම් පැති කාණුව දාන්නකෝ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපේ සභාවේ TO මහත්තයයි, ප්‍රාදේශීය ලේකම් එකේ TO මහත්තයයි දෙන්නම යවලා ලක්ෂ 20 ක ඇස්තමේන්තුව හදන්න කියන්නකෝ. බලප්‍රදේශයට වැඩ කරන්න ඕන නේ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළාත් පාලන ඉංජිනේරුතුමා ඇවිත් අඩියෙන් අඩියට බලලා ඇස්තමේන්තුව හදලා තියෙන්නේ. බදාදාට වැඩ පටන් ගන්නවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ පාර සංවර්ධනය කරන කොට බෝක්කු පවා දාලා හදන්නේ. හොඳට තියෙන පාර කඩලා හදලා මට පාර හැදුවා කියලා වැඩක් නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පොඩි අවස්ථාවක් ඉල්ලනවා, මේ සිද්ධිය සම්බන්ධව සැහෙන්න වෙලාවක් බලාගෙන හිටියා. ඇත්තටම අපේ ප්‍රාදේශීය සභාව මේ මට්ටමේ තියෙන්නේ ඇයි කියලා මට පුදුම හිතෙනවා. සංවර්ධන වැඩ සඳහා කරන අරගලය නිසා පක්ෂ විපක්ෂ සියලු දෙනා එකතු වෙලා. මේක මෙහෙම වුනා නම් කොහෙන් කෙලවර වේද කියලා මට හිතා ගන්න බෑ. ඇත්ත කාරණය මෙහෙමයි. දැන් මේ කරන අරගලය ඒ ප්‍රදේශයේ සංවර්ධන වැඩ කටයුතු උදෙසාමද?, නැත්නම් ඒකේ වටිනාකම අත්පත්කර ගන්නද?. ඒ හින්දා කවුරු හැදුවත් මේ මහජන මුදල්. මධ්‍යම ආණ්ඩුවෙන් ආවත්, පළාත් සභාවෙන් ආවත්, ප්‍රාදේශීය සභා අරමුදලින් කරත්, මේ මහජන මුදල්. ඒ හින්දා අපි කාටත් වගකීමක් තියෙනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දවස් දහයක් ඇතුළත මේ පාර හදලා ඉවර කරනවා මම.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මම යෝජනා කරනවා බෙදා ගන්න අරගල කරනවාට වැඩිය මේක සම්පූර්ණ කරන්න හිතෙනවානම් ඒක තමයි වැදගත් වෙන්නේ. මේකේ ගොඩ බෙදාගන්න නෙමෙයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම බොහොම වගකීමෙන් කියනවා අපි ලක්ෂ 10 න් උපරිම ප්‍රයෝජන අරන් තියෙන්නේ. මැද වල තියෙන තැනට බෝක්කුවකුත් එනවා. සම්පූර්ණ පාරේම වලවල් ටික වැහෙනවා. සෙකන්ඩ් කෝඩ් එක මීටර් 580 ක් දානවා. පාරේ වැඩ 75% ක් ඉවරයි.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පාරේ වැඩ ලබන බදාදා පටන් ගන්නවා. තුසිත මන්ත්‍රීතුමා ලබන බදාදා වෙනකොට වැඩ පටන් ගන්න කටයුතු කරන්න. සේරියගොඩ පාර පිළිබඳ එච්චරයි.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 01. එස්.ඕ.එස් පෙර පාසල සඳහා හවුල්කාරිත්වයක් ලබා ගැනීම. (ලලින්ද ගමගේ මයා, ප්‍රාදේශීය ලේකම්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)

එස්.ඕ.එස් ළමා ගම්මාන සංවිධානය සමඟ සාකච්ඡා කරලා එකඟතාවයකට පැමිණිලා 2020 වසරේ සිට එස්.ඕ.එස් පෙර පාසල සඳහා හවුල්කාරිත්වය ලබා දෙන්න මම යෝජනා කරනවා. මේකේ පැහැදිලිවීම් අඩුයි. අපිට ගැටලු තියෙනවා. පෙර පාසල් පාලිකාවන් බඳවා ගන්න ගැටලු තියෙනවා. පෙර පාසල් පාලිකාවන්ට වැටුප් ගෙවන්නේ කොහොමද කියලා ගැටලු තියෙනවා. ඒ පිළිබඳව අපි සාකච්ඡා කරන්න ඕන. සභා තීන්දුවක් ගමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක ඉතාමක් වටින යෝජනාවක්. විශාල සම්පත් ප්‍රමාණයක් මේකෙන් සභාවට අත්පත් කර ගන්න පුලුවන්. පෙර පාසල් ළමුන් 100 ක් ඉන්නවා කියලා තියෙන්නේ. ප්‍රදේශයට විශාල සේවයක් කරන්න පුලුවන්. මේකට සභාව විදියට අපේ පැත්තෙන් දායකත්වය දෙන්න පුලුවන්නම් ඒක ගොඩක් වටිනවා. ඒක නඩත්තු කරගෙන යන්න යම් පිරිවැයක් දරන්න සිදු වුනත් තියෙන පරිපාලන ගැටලු විසඳගෙන සාකච්ඡා කරලා මේකට අනුග්‍රහය දක්වනවා නම් ඒක ගොඩක් වැදගත්. ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

අපේ පෙර පාසලට ක්‍රමවේදයක් නැතුව තමයි ළමයි බඳවා ගෙන තියෙන්නේ. දැන් මේ සැරෙත් මට තියෙන ගැටලු ටික නිරාකරණය කර ගන්න බැරිවුනා. සභාවේ පෙර පාසල් සඳහා අඩු ආදායම් ලාභීන්ගේ ළමුන් පමණක් බඳවා ගැනීමට මම අදහස් කරනවා. ඒකට ලබන වර්ෂයේදී අපි සභා තීන්දුවක් ලබා ගන්න ඕන. අනිවාර්යයෙන් ග්‍රාම නිලධාරි වාර්තාව අරගන්න ඕන. ළමුන් වැඩිපුර අරගන්න බෑ. පෙර පාසල් පාලිකාව ඉන්නෙත් කම්කරු පත්වීමක් යටතේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, පෙර පාසල කියලා හැමදාම සඳහන් කරන්නේ එකම පෙර පාසලක්. හැබැයි හිරිඹුරගම පෙර පාසලට පහසුකම් ඇත්තෙම නෑ. මම අදත් සුද්ද කරන්න මිනිස්සු යොදවලා ආවේ. හැමදාම මේ ටික කතාකරනවා විතරයි. ආරක්ෂිත වැට ගහනවා කිව්වා. ළමයෙකුට සෙල්ලම් කරන්න තැනක් නෑ. එක ඔන්චිල්ලාවක්වත් නෑ. ළමයින්ට සෙල්ලම් කරන්න. ඒකත් සංවර්ධනය කරන්න ඕන. ඒ ටිකවත් වෙන්නේ නෑ මෙතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ ඇස්තමේන්තු සකස් කරලා වැඩ පටන් ගන්න තියෙන්නේ. ඒ ටික ඉදිරියේදී සිදු කරාවි.

02. රජයේ ඉඩම් ලැබීමට සුදුස්සන් ලියාපදිංචි කිරීම - 2019 (ටී. ජී. සරත් කුමාර මයා දකුණු පළාත් ඉඩම් කොමසාරිස්)

ඒක ගැන දැනුවත් කරන්න. ඉඩම් නැති රජයේ ඉඩම් ලැබීමට සුදුසු අය පෙබරවාරි 28 ට කලින් මේ අයදුම්පත් දාන්න ඕන. මේකේ අයදුම්පත්‍රයත් එක්කම ඇති.

03. තාක්ෂණික කමිටු දීමනාව වැඩි කර දෙන ලෙස ඉල්ලීම. (රනිල් වික්‍රමසේකර මයා, පළාත් පාලන කොමසාරිස් දකුණු පළාත)

ඒක පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දෙන කමිටුව. දැනට රුපියල් 500 යි දෙන්නේ. මධ්‍යම පරිසර අධිකාරියේ ඉල්ලීමට තමයි පළාත් පාලන කොමසාරිස්තුමා මේ ලිපිය යොමු කරලා තියෙන්නේ. මොකද ඒකට කරන්නේ. වැඩි කරනවාද? අපි ඒකට සභා තීන්දුවක් ගන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මධ්‍යම පරිසර අධිකාරියේ ඉල්ලීම පළාත් පාලන කොමසාරිස්තුමා හරහා යොමු කරලා තියෙන්නේ. දැනට රුපියල් 500 ක් ගෙවනවානේ. සැලසුම් කමිටුවට රුපියල් 750 ක් ගෙවනවා. රුපියල් 250 කින් වැඩි කරන්න නම් කමක් නෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** පරිසර ආරක්ෂණ බලපත්‍රය ක්‍රියා පරිපාටියට අදාළව තාක්ෂණික සමාලෝචන කමිටුව සාර්ථකව හා අඛණ්ඩව පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින් කමිටු සාමාජිකයන් දිරි ගැන්වීම සඳහා ලබා දෙන දීමනාව රුපියල් 750 ක් කිරීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. ව්‍යාපෘති කළමනාකරණ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම. (එම්. එස්. එම්. රිස්මි මයා, අධ්‍යක්ෂක, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය)

මේ පිළිබඳ කැමැත්තක් දක්වන අය ඉන්නවා නම්, නම් ලබා දෙන්න.

05. කිරිමැටිමුල්ල පාර (ඉන්ලන්ඩ් හිල් පාර) අවහිර කිරීම (ගරු ලේකම් ගොඩකන්ද රාජ්‍ය හා සංස්ථා නිලධාරීන්ගේ සුභ සාධක සංගමය)

කිරිමැටිමුල්ල පාර දෙපස වාහන නතර කර තැබීම තහනම් කරලා සවිකරන්න ඕන දැන්වීම් පුවරු ගොඩකන්ද රාජ්‍ය හා සංස්ථා නිලධාරීන්ගේ සුභ සාධක සංගමයේ අනුග්‍රහය යටතේ සකස් කර ලබා දුන් පසු අප ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ මාර්ගය දෙපස සවිකරන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් ස්ථාපනය කිරීම සඳහා අවසර ලබා ගැනීම. (ගරු ලේකම්, ශ්‍රී මිහිඳු යෞවන සමාජය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට හිතෙන්නේ දැන් තියෙන පන්සල් ටික දියුණු කරන්න වැඩ කරනවා දෙපැත්තෙම කට්ටිය. මහින්ද රාජපක්ෂ මැතිතුමත් පන්සල් දියුණු කරන්න වැඩ කරනවා. දැන් අපේ නායකතුමාත් පන්සල්, පල්ලි, කෝවිල් ඔක්කොටම වියදම් කරනවා. මේ ගස් ගල් යට බුදුපිළිම සවිකරන්න ගියාම හානියක් ඇත්තටම. අපේ උගත් බුද්ධිමත් මන්ත්‍රීවරු විදියට මේවා ගැන කතා කරන්න. හන්දි ගානේ බෝගස් යට, නුග ගස් යට මේවා තියන්න ඕන නෑ. නියෝජ්‍ය සභාපතිතුමා උරණ වෙන්න එපා මාත් එක්ක. ඊළඟට අපේ මහායාන ආගම පිළිබඳ ප්‍රශ්නය. මම දැක්කේ ඒක මේ යන විදියට ආගමික යුද්ධයක් වෙනවා අන්තිමට. හන්දි ගානේ මෙහෙම කරනවාට මම නම් පෞද්ගලිකවය විරුද්ධයි. පන්සල් තියෙනවා අපිට ඇතිවෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි නිකං අමනාප කර ගන්න ඕන නැනේ. අපි අනුමත කරලා තියමු. ඒගොල්ලෝ ඉදිරි කටයුතු කර ගනීවි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මහායාන මධ්‍යස්ථානය පිළිබඳ කතා කරා. ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. මොකද මහායාන මධ්‍යස්ථානයේ නාමපුවරු ඉදිකිරීම මේ සභාවේදීම තහනම් කරා. දැන් මේ වන විටත් ඒ පුවරුව ප්‍රදර්ශනය කරනවා තාප්පය අයිනේ. මම ඔබතුමාව දැනුවත් කරා මුදල් කමිටුව වෙලාවේදී.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඇත්තටම මේ සහෝදර තරුණ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලනවා ඔබතුමාලට තමයි ලෝකේ වෙනස් කරන්න පුලුවන්. අපේ කාලේ දැන් ඉවරයි. ඔයා ඒක

ගැන හොඳට හිතන්න මන්ත්‍රීතුමා. එතනින් නරකක් කරන්නේ නෑ නේ. කුඩු ව්‍යාපාරයක් යනවානම් කවුරුහරි මරන්න කොටන්න යනවානම් ඒවාට විරුද්ධ වෙන්න. ඔය පාරවල් හදන වැඩ වලට කතා කරලා උපකාර ගන්න ඒගොල්ලන්ගෙන්. සභාවේ වැඩ ගොඩක් කරගන්න පුලුවන් මන්ත්‍රීතුමා.

ඒ වගේ ස්ථානයක බෝඩ් එකක් දාලා තියෙනවානම් ඒක පෞද්ගලික දෙයක්. ඒක ඇතුලේ දාලා තියෙන්නේ. ඒකට සභාවට කරන්න පුලුවන් දෙයක් නෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ බෝඩ් එක තහනම් කරන්න සියලුම මන්ත්‍රීවරු එකඟ වුනා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම එකඟ වුනේ නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම දන්නේ නෑ. එදා නම් එකඟ වුනා. ඒ බෝඩ් එක සවිකරලා තියෙනවා. ඒකෙන් වෙන්නේ අපේ ආගම විකෘති කිරීමක්. ඒක අපිට අනුමත කරන්න බෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මෙහෙමයි මන්ත්‍රීතුමා, ඒක ඇතුලේ ගහපු බෝඩ් එකක්. ඒ ගැන ආදායම් පරීක්ෂක දැනුවත් කරලා කරන්න පුළුවන් දෙයක් කරන්නම්. එදා ඉදපු ස්ථාවරය තමයි මම අදත් ඉන්නේ. විශේෂ සම්බන්ධකම්වත් එහෙම මුකුත් නෑ. එහෙම ගැටලු නෑ. අපිට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග ගන්නම්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේ සම්බන්ධ මටත් පොඩි අදහසක් දක්වන්න ඕන. බුද්ධ මන්දිර මාර්ග වල, හන්දි වල ඉදිකිරීම් සම්බන්ධව කපුහෙම්පල, නුග බෝධිය, කාක බෝධිය ඒක නොයෙක් විදියට හැඳින්වූවා. පැරණි සිද්ධස්ථානයක් සභාපතිතුමනි ඒක. නටඹුන් ආරක්ෂා කරලා තමයි ඒ ප්‍රතිසංස්කරණ කටයුතු අපි ආරම්භ කරේ. තරුණ පරපුර හන්දි ගානේ බුද්ධ මන්දිර ඉදිකරත් අදාල පේරුවට අදාල විහාරස්ථානය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අවසර ඇතිව ඒ කටයුත්ත කරනවා නම් අපිට ගැටලුවක් නෑ. සභාවක් හැටියට මාර්ග වලට අවහිර වෙන්න ඉදිකරොත් ගැටලුවක් තියෙනවා.

අබේසේකර මන්ත්‍රීතුමා කිවුවා වගේ හැම හන්දිය ගානෙම බුද්ධ මන්දිර ඉදිකිරීම නිසා අවහිරතාවයක් තියෙනවා. ඒ හින්දා මේක වඩාත් නිවැරදිව බෞද්ධ ආගමට අගෞරවයක් නොවන විදියට සකස් කරනවා නම් ඒක හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ ක්‍රමවේදයක් තියෙනවා. බෞද්ධ කටයුතු අමාත්‍යංශයෙන් නිර්දේශ ගන්න ඕන. අපේ විරුද්ධත්වයක් නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම නම් බොහොම පැහැදිලිවම මහායාන, හීනයාන කියලා ආගමික ඇදහිලි වලට තහංචි දානවා නම් ආයතනයක් මම ඒකට පෞද්ගලිකව විරුද්ධයි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** දැන් නාගරුක්ඛාරාම පාරට යනකොටත් තියෙනවා බුදු පිළිමයක්. මෙතන තරුණ කොටස් ඉල්ලලා තියෙන්නේ. ඒ නිසා ඒකට අවසර දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධ මට විනාඩියක් කතා කරන්න අවශ්‍යයි. හැම ගෙදරකම බුදු පිළිමයක් තියෙන්නේ වන්දමාන කරනවා, හන්දි වල ත්‍රීවිල් රථ නවාතැන් තැන්වල පවා ඉතාම පිරිසිදුව ඉදිකරලා ඒ අය වන්දමාන කරගෙන යනවා. ක්‍රිස්තියානි ආගමේ අයත් ඒක කරනවා. උදේට ගමනක් යනකොට බුදුන් සිහිකරලා පඬුරක් දාලා යන තැන් තියෙනවා. දැනට අපි දකින මේ ප්‍රදේශය තුළ බුදු පිළිම එහෙම අවභාවිතා වෙලා නෑ. ඒ නිසා

නිර්දේශයක් හැටියට සභාපතිතුමාගේ යෝජනාවට මම ගරු කරනවා. ගම්මානයක් හැටියට ඒ අය එකතු වෙලා යම් ආගමික කටයුත්තක් කරනවා නම් ඒකට විරුද්ධ වෙන්න එපා කියලා මම කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 07. පලාගලකන්ද පුළුල් කිරීම නිසා නිවස අනාරක්ෂිත තත්වයකට පත්වීම (එල්. ඩබ්. සිරිවර්ධන මයා, පලාගල කන්ද, කිතුලම්පිටිය, උළුවිටිකේ)

ඒක වෙලා තිබුනේ සභාව නැති කාලේ බැකෝ යන්ත්‍රය යොදා ගනිමින් බැම් බැඳලා දෙනවා කියලා පලාගල කන්ද ප්‍රදේශයේ කණ්ඩි කපලා තිබුණා. සිරිවර්ධන මහත්තයගේ ගේ කිට්ටුවටම කණ්ඩි කපලා තියෙනවා. සම්බන්ධීකරණ කමිටුවෙන් තීරණයක් අරන් තිබුණා. සභාවෙන් වෙච්ච වැරැද්දක් ඒක පහුගිය කාලේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක සභාවෙන් වෙච්ච වැරැද්දක් නෙමෙයි. පලි ගැනීමට කරපු වැඩක්. පාර සංවර්ධනය කරනවා කියලා කරේ. පාරේ ආරම්භක ස්ථානය අඩි 08 ක් විතර. ඒක දේශපාලන පලිගැනීමට කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවෙන් මැදිහත්වෙලා ඒක කරේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ලේකම් මිස් ඉන්න කාලේ ඒ සිද්ධිය වුනේ. දේශපාලන මැදිහත්වීම මත දේශපාලන පලිගැනීම් මත ඒක සිදු වුනේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ කතාව හරි. පලාගල කන්දට පිවිසුම් මාර්ගය දෙපසින්ම තියෙන්නේ අඩි 08 යි. ඉතින් එතනදී ආණ්ඩු පෙරලියක් සමඟ යම්කිසි පිරිසක් අමන විදියට ක්‍රියා කරලා මේ පාරේ කාණු පද්ධතිය සකස් කරනවා කියලා මෙහෙන් ඉල්ලීමක් කරාම මෙහේ JCB යන්ත්‍රය යොදාගෙන ප්‍රාදේශීය ලේකම් එකේ ඉල්ලීමක් මත මේ කණ්ඩි කඩලා තියෙන්නේ. ඉතින් එතනදී සභාව යම් මැදිහත්වීමකින් කරලා තියෙන්නේ. JCB යන්ත්‍රය ඒ සඳහා පාවිච්චි කරලා තියෙනවා. අවසානයේ පස් කණ්ඩියේ කැඩුණු තැනක බැම්මක් ඉදිකරලා තියෙනවා පළාත් සභා අරමුදලකින් අවුරුදු 02 කට පස්සේ. අනිත් කෙනාගේ කණ්ඩිය ටිකක් කැඩුණු ටික තවත් රජයේ මුදලකින් ඉටු කර ගත්තා. පලාගල කන්ද කියන්නේ ජනපදයක්. මිනිස්සුන්ට නොමිලේ දීලා තියෙන්නේ. ඉඩම් මිලදී ගන්න සල්ලි නැති ජනතාවක් ඉන්නේ. ඒ අයට තාප්ප බැඳගන්න සල්ලි නෑ. කඳු ප්‍රදේශ ඒවා දුෂ්කරයි. වතුර පාරවල් එනවා. සිරිවර්ධන මහත්තයගේ ගෙට අඩි 02 ක් විතර තියෙද්දී කණ්ඩිය කපලා තියෙන්නේ. ගේ, කණ්ඩියෙන් පාරට එන තත්වයට ඇවිත් තියෙන්නේ. ඒ මනුස්සයට සාධාරණයක් ඉටුවිය යුතුයි. කරුණාකරලා මේ තත්වය අවබෝධ කරගෙන සභාවෙන් යම්කිසි මැදිහත්මක් කරලා තියෙන නිසා මේ කාරණය ඉටු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තීරණය අරන් තියෙනවා. ඒකත් අපිට යොමු කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එල්. ඩබ්. සිරිවර්ධන මහතාගේ නිවසේ අනාරක්ෂිතබව ඉවත් කිරීම සඳහා ගල් බැම්මක් සභා අරමුදලින් ඉදිකිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. කාල්ටන් සිටි සුභ සාධක සංගමය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම (ලේකම්, කාල්ටන් සිටි සුභ සාධක සංගමය)

ඒගොල්ලන් අපෙන් ඉල්ලන්නේ අවසරය. මුදල් ඒගොල්ලන්ගෙන්. මම තාක්ෂණ නිලධාරිතුමියට කිවුවා අපේ අධීක්ෂණය යටතේ ඇස්තමේන්තුවක් සකස් කරලා දෙන්න කියලා. ගොඩනැගිල්ල ඒගොල්ලන්ගේ මුදලින් හදන්නේ. අපිට අවසර දෙන්න විතරයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා මේක තුන්හිරිපාන ග්‍රාම නිලධාරි වසමේ පිහිටලා තියෙන්නේ. වෙන්දේසි කරපු ඉඩමක්. සභාව සතු පර්චස් ප්‍රමාණය ඒගොල්ලන් ඉල්ලන්නේ.

නමුත් සභාපතිතුමා මම අදහස් කරන්නේ යම්කිසි භූමි ප්‍රමාණයක් නිර්ණය කරලා ඒගොල්ලන්ට දීමයි වඩා සුදුසු. මේක විශාල භූමියක්. පර්චස් 100 ක් විතර මේ භූමිය තියෙනවා. මේකේ අපි තීරණය කරන තැනක හදන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක තාක්ෂණ නිලධාරි අධීක්ෂණය යටතේ කරන්නේ. අපි කරන්න ඕන දෙයක් ඒගොල්ලන් කරනවා. ගමේ තියෙන එකම සමිතිය ඒක.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක වෙනත් ප්‍රජා කටයුතු සඳහා භාවිතා කරන්නත් පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ඉඩම තියෙන්නේ ඇතුලේ අයගේ පරිහරණය සඳහා. ඒගොල්ලන් තමයි ඉල්ලන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපි නිශ්චිත භූමි ප්‍රමාණයක් දෙමු දෙනකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කාර්මික නිලධාරි අධීක්ෂණය යටතේ කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** කාල්ටන් සිටි නිවාස සංකීර්ණය අප ප්‍රාදේශීය සභාව සතු භූමිය තුළ කාල්ටන් සිටි සුභ සාධක සංගමය සඳහා 20´x20´ ප්‍රමාණයේ ස්ථිර ගොඩනැගිල්ලක් අප ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරි අධීක්ෂණය යටතේ ඉදිකිරීම සඳහා අවසර ලබා දීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

09. අන්තර් යෞවන සමාජ හා ක්‍රීඩා සමාජ  ක්‍රීඩා උළෙල 2019 ( සුභාෂි සී. විදාන පතිරණ මිය සහකාර ප්‍රාදේශීය ලේකම්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ජාතික යෞවන සමාජ හා ක්‍රීඩා සමාජ ක්‍රීඩා උළෙලට සමගාමීව බෝපෙ පෝද්දල අන්තර් යෞවන සමාජ මලල ක්‍රීඩා උළෙල වෙනුවෙන් නියමිත කණ්ඩායම් තරග අතුරින් 2019.02.24 දින පැවැත්වීමට නියමිත පාපන්දු තරග පැවැත්වීම සඳහා ලබුදූව උසස් තාක්ෂණ විද්‍යාලය අසල අප ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාංගනය නොමිලේ ලබා දීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව - 2019 දෙවන කණ්ඩායම (එච්. එස්. එම්. රිස්මි මයා, අධ්‍යක්ෂක, පළාත් පාලන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය)

එම පාඨමාලාව හදාරන්න කැමති අය නම් ලබා දෙන්න.

11. සංචාරක සත්කාරක සේවා සංවර්ධනය සඳහා තෛමාසික පුහුණු පාඨමාලාව (CRAFT LEVEL CONCERT ) පැවත්වීම ( නිහාල් වීරසිංහ මයා, සභාපති, රුහුණු සංචාරක කාර්යංශය)

එම පාඨමාලාව හදාරන්න සුදුසු, ප්‍රදේශයේ ඉන්න අයව දැනුවත් කරන්න.

12. නැවත සොයා බලා සාධාරණයට නිසි ක්‍රියාමාර්ගයක් ගැනීම (ප්‍රියංකා ගුණසේකර, අඹගහවත්ත, වැලිපිටිමෝදර, ගිංතොට)

මේ අර අපි තාප්පයක් බඳින්න අවසර දුන්නේ දයාරත්න ගමගේ මහත්තයට. ඒකේ කොන්ක්‍රීට් ලෑලි ඒවා තියෙනවලු. කලින් අයින් කරන්න ගියාම විරුද්ධ වුන නිසා අයින් කරන එක නැවැත්තුවා. නැවතුනේ පස් ටික ආපු නිසා. දැන් ඒ තාප්පය දාලා තියෙන්නේ. වැටුන කොන්ක්‍රීට් ටික අයින් කරලත් නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දයාරත්න මහත්තයා මේ ටික අස් කරන්න ගියා. ඒගොල්ලන් විරුද්ධ වුනා. මේකට පොලීසිය ගියා. පොලීසියේදී කියලා තිබුණා එයාලා අස් කරන්නේ නෑ. මෙයාලට අස්කරගන්න කියලා. මේක තමයි තත්වය දැන්. අදාල ලිපියට යවන්න ඕන නම් අස් කරන්න කියලා. ඒ දෙගොල්ලන් රණ්ඩු වෙලා හදා ගනිපු ප්‍රශ්න ඕවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දෙපාර්ශවය එකතු වෙලා සාකච්ඡා කරලා කොන්ක්‍රීට් බැම්මේ සුන්බුන් ඉවත් කර ගැනීමේ ගැටලුව සම්මතයට පත් කර ගන්නා ලෙස දැනුම් දෙන්න යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

13. මීපාවල දෙල්ගහවත්ත මාර්ගය පුළුල් කිරීම ( චමින්ද ගමගේ මැතිතුමා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව, පෝද්දල කොට්ඨාශය)

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව පොඩි කාලයක් ඉල්ලනවා පොඩි පැහැදිලි කිරීමක් කරන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** දෙල්ගහවත්ත මාර්ගය, මීපාවල තැපැල් කන්තෝරුව ඉදිරිපිට තිබෙන කොන්ක්‍රීට් මාර්ගය 2013 ඔක්තෝම්බර් මාසයේ මේ සභාව තීරණයක් අරන් තියෙනවා සභා යෝජනාවක් අනුව මාර්ගය පුළුල් කිරීම සඳහා. ඒ අනුව දැන් කටයුතු සිදු කරලා අවසන්. මේ වෙනකොට පවරා ගැනීම සඳහා විරෝධතා දැක්වීමට අවස්ථාව දීලා තියෙනකොට තමයි මම මේ සම්බන්ධව දැන ගත්තේ. ඒ සම්බන්ධව මම සොයා බැලීමේදී ඉතා පැහැදිලිව තේරුම් ගියා ඒක පාර්ශ්විකව එක් පුද්ගලයෙක් හරහා පමණක් මේ කර්තව්‍ය සිදු වන බව. බොහොම පැහැදිලිව මම වගකීමෙන් ප්‍රකාශ කරනවා. එතුමා ප්‍රකාශ කරනවා මාර්ගයේ ජලය බැසයන්න තමයි මේ කාණු පද්ධතිය අවශ්‍ය කියලා. නමුත් මේ මාර්ගය සකසන්න කොන්ත්‍රාත්කරු මේ වන විටත් ඉන්නවා. එතුමා එක්ක සාකච්ඡා කරාම එතුමා බොහොම පැහැදිලිව වගකීමෙන් කියනවා. සභාවට ඇවිත් ප්‍රකාශයක් කරන්නත් එතුමා සූදානම්. මේ කියන වෛද්‍යවරයා එතුමාගේ ගේ දොරකොඩ කොන්ක්‍රීට් කරනකොට ඒ ලෙවල් එක සම මට්ටමට කොන්ක්‍රීට් කරගෙන එනකොට බොහොම පැහැදිලිව විරුද්ධ වෙලා කිවුවලු මේක දාන්න දෙන්නේ නෑ පහත් කරලා දාන්න කියලා. තාක්ෂණ නිලධාරි ඉන්නවා නම් එතුමා කියාවි. තාක්ෂණ නිලධාරිත් එකට විරුද්ධ වෙලා තියෙනවා. මම දන්නේ නෑ ඊට පස්සේ කොහොම විරුද්ධ වුනාද කියලා. මේ වෛද්‍යතුමා තමන්ගේ තාප්පය අයිනෙන් වැටියක් දාලා තියෙනවා. වතුර ටික එයාගේ ඉඩමට නොයන්න. ඒ අනුව එතුමා ඉල්ලීමක් කරනවා සභාවෙන් නිවසේ සිට පාරට යනකම් පමණක් පාර පුළුල් කරන්න කියලා. මා විරුද්ධ නෑ මාර්ගයක් පුළුල් කිරීමට. පොදු ජනතාවගේ යහපත උදෙසා මාර්ගය පුළුල් කරනවා නම් පුළුල් කල යුත්තේ ආරම්භය සිට අවසානය දක්වාම. එක් පුද්ගලයෙකුගේ නිවසට පමණක් මාර්ගය පුළුල් වෙනවා නම් ඒකට බොහොම පැහැදිලිව මා විරුද්ධ වෙනවා. ගරු සභාවේ මන්ත්‍රීවරුන් ඒකට විරුද්ධ ඇති. මම කරන්නේ පාර පුළුල් කිරීමේ විරෝධතාවයක් නෙමෙයි. එක් පාර්ශ්වයකින් එක් පුද්ගලයෙකුගේ ඉඩමක් පමණක් අරගෙන මේ පාර පුළුල් නොකරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. පාර පුළුල් කිරීමට ඉඩම ලබා ගන්නා පුද්ගලයාගේ ඉඩම පර්චස් 08 යි. ඒ මනුස්සයගෙන් විතරයි මේ ඉඩම ගත්තෙත්. 2017.07.03 වෙනිදා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ලියුමක් එවනවා මීපාවල දෙල්ගහවත්ත පාරේ ආරම්භක කොටස පුළුල් කිරීම සඳහා ඔබ සභාව විසින් ඉඩම් අත්පත් කර ගැනීම සිදු කරන්නෙත් මාර්ගය එක් පසකින් පමණි. මෙසේ සිදු කිරීමට හේතුව ගොනුවේ සඳහන්ව නැති නමුත් තාක්ෂණ නිලධාරින්ගෙන් විමසීමේදී අනාවරණය වූයේ අනෙක් පස තාප්පයක් ඇති හෙයින් අත්පත් කර ගැනීමේ පිරිවැය අවම කර ගැනීම සඳහා මේ තීන්දුව ගත්තා කියලා. මම ඒකට අකමැතියි. විරුද්ධයි. හේතුව වෛද්‍යතුමාගේ නිවසට පමණයි මේ පාර පළල් වන්නේ. එක් පුද්ගලයෙකුගේ ඉඩමක් පමණයි මේ අත්පත් කර ගත්තේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මේක ගැන සොයා බලා වහාම අත්හිටුවන ලෙස මම යෝජනාවක් විදියට සභාවට යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීවරුන්ට අදහස් තියෙද ඒ සම්බන්ධව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙම පාර පුළුල් කිරීම සම්බන්ධව බොහොම පැහැදිලි සහා තීන්දුවක් අරගෙන දැන් ඒකේ මැද්දකටත් එහාට ගිහින්

තියෙන්නේ අවශ්‍ය කටයුතු කරමින්. ඉතින් ඒවෙලේ මේ ප්‍රදේශයේ තවත් මන්ත්‍රීවරුන් හිටියා. මමත් හිටියා. මම දැක්කා මෙතන තියෙන අසාධාරණය. මේ අසාධාරණය දැකලා අපි පාර පළල් කරන්න ඕන කිවුවේ. මේ පාර මුල පටන් ගැනීමේදී කවුරුවත් හිතන්න එපා වෛද්‍යතුමාගේ නිවස ගාවට විතරයි මේක කරන්නේ කියලා. මේ අය අද වෙනකොට මුදලුත් බැඳලා ඉවරයි. රු. 125,000.00 ක මුදලක් බැඳලා තියෙන්නේ. මේ නිසා මේකේ යන්න ඕන අදියර ගිහිල්ලා. දැන් මේකට බාධා කිරීමෙන් වෙන්නේ වැඩක් නැති දෙයක්. මම බොහොම කාරුණිකව ඉල්ලා සිටිනවා සියලු මන්ත්‍රීවරුන්ගෙන් මේකට තීන්දු තීරණ දැන් ගන්න එපා. අවුරුදු කීයක් වෙනවද මේකට. දැන් මේ පිළිබඳව තීන්දු ගන්නවා කියන්නේ මේ සභාවේ මුකුත් කරන්න බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන සභාවෙද ඕකට තීන්දුව අරගෙන තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 2013 විතර

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** 2013 ඔක්තෝම්බර් සභාවේදී යෝජනා කරලා තියෙන්නේ. චානක මාදුගොඩ සභාපතිතුමා. ස්ථිර කරලා තියෙන්නේ පද්මසේන මන්ත්‍රීතුමා. මම කියන්නේ එක පැත්තකින් විතරක් පළල් කරන්න එපා කියලා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕක පටන් ගැනීමේ බොහොම පැහැදිලිව තියෙනවා ජේමසිරි මදනායක මහත්තයලගේ ගෙදර. ඒකෙත් ළිඳ තියෙනවා. ඒ ළිඳත් එක්ක ඒක කරන්න බෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මේ ලියුම මම අද උදේ සභාවට භාර දුන්නේ. අබේසේකර මන්ත්‍රීතුමා ෆොටෝස් එක්ක. චිත්‍ර එක්ක සූදානමින් පැමිණිලා තියෙනවා මේකට උත්තර දෙන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් අබේසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාත් මේක අසාධාරණයි කියලා පිලිගන්නවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අසාධාරණ විදියට තිබුනේ මේ තත්වය. ඒ නිසා තමයි මේ යෝජනාව ගෙනාවේ 2013 දී. අපි එදා කවුරුවත් මේකට විරුද්ධ වුනේ නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට මට දැන් ඇවිල්ලා තියෙනවා විරෝධයක්. ගොඩකන්ද කියන මහත්මයාගේ ඉඩමෙන් තමයි මේක යන්නේ. ප්‍රාදේශීය ලේකම්තුමා හා නිලධාරීන් එක්ක සාකච්ඡා කරාම කිසි ගැටලුවක් නෑ. නැවත පරීක්ෂණයක් සඳහා යොමු කළ හැකියි. මම දැනගන්න කැමතියි රු.125,000.00 කොහාටද මුදලින් බැන්දේ. සභාවටද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටද?. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් බැන්දේ නෑ කියලා මට පැහැදිලිව කිවුවා. මේ සඳහා හොයලා බලලා තමයි මේ කතා කරන්නේ. කිසි ගැටලුවක් නෑ. මා විරුද්ධ නෑ පාර පළල් කරනවට. ඒක පාර්ශ්වීය වෙන්න බෑ. එහෙම නම් මුළු පාරම පළල් වෙන්න ඕන. ඒකට සභාව කටයුතු කරන්න ඕන කියලා මම ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ සම්බන්ධව මමත් බලන්න ගියා. අවාසනාවකට පාර පටු වෙලා එන තැන තමයි ඩොක්ටර්ගේ ගෙදර තියෙන්නේ. සම්පූර්ණ පාරම පළල් වෙනවා ඒකේ. පළල් වෙලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අඩි කීයක් පාර පළල් වෙනවද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අඩි 02 ක්ද කොහෙද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දෙපැත්තෙන් ගත්තා නම් ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක දෙපැත්තෙන් ගන්න බෑ. ළිඳවල් තියෙනවා. මේගොල්ලත් හිතන් ඉන්නේ ඩොක්ටර්ගේ ගෙදරට පාර පළල් වෙනවා කියලා. පාර පළල් වෙලා තියෙන්නේ. මේ ටික විතරයි පළල් වෙන්න තියෙන්නේ. ඒක තමයි දැන් ප්‍රශ්නය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ කියන එක හරිද?.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමා ගිහින් පරීක්ෂා කරලා බලන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉඳපු සභාපතිතුමා හා උපසභාපතිතුමා ගනිපු තීන්දුවක් මේක. අපිට අදාළ නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපි එක්සත් ජාතික පක්ෂයෙන් කතා කරන්න ඕන ප්‍රශ්නයක් නෙමෙයි මේක. මම ඒ ඩොක්ටර්ව අඳුරනවා. මම එතනට ගියා බලන්න. මම මොන පක්ෂයේද කියලා දන්නෙත් නෑ. බලන්න ගියාම මට අධීක්ෂණය වුනේ. ඩොක්ටර්ගේ ගෙදර කිසි අදාලත්වයක් නෑ මෙතන.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පක්ෂ පාටක් ගන්න එපා. ගරු සභාපති විදියට හිටියේ එතකොට චානක මාදුගොඩ මැතිතුමා. එතුමා එක්කත් මම සාකච්ඡා කරා. යෝජනාව ස්ථිර කරලා තිබුනේ පද්මසේන මාවැල්ලගේ මැතිතුමා. මම එතුමා එක්ක සාකච්ඡා කරා. එතුමා කියන්නේ යෝජනා කරේ මුලු පාරම. එක තැනකින් ගන්න යෝජනා කරලා නෑ. සභා වාර්තාව මා සතුව තියෙනවා. මේකේ කියන්නේ නෑ එක කොටසක් ගන්න කියලා. මුලු පාරම ගන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මේ පාර ඉතුරු ටික පළල් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒක පළල් කරන් ඇවිල්ලා නෑ මන්ත්‍රීතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ස්ථානීය පරීක්ෂණයක් කරමු.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ස්ථානීය පරීක්ෂණයක් ඔබතුමා කරන්න. එතකන් මේ යෝජනා අනුව ඕක අත්හිටු වන්න. ඊට පස්සේ ඔබතුමා පරීක්ෂා කරලා නිවැරදි දේ කරන්න කියලා බොහොම ගෞරවයෙන් ඉල්ලනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මේ සම්බන්ධව තාක්ෂණ නිලධාරීතුමා එක්ක කතා කරාට පස්සේ වෛද්‍යතුමා මගේ සහෝදරයට කතා කරලා කියලා තියෙනවා. එතුමට මේකට ඇඟිලි ගහන්නේ නැතිව කට පියන් ඉන්න කියලා. එහෙම බයෙන් මම දේශපාලනේට ආවේ නෑ සභාපතිතුමා. ඒ නිසා ඔබතුමා මේක නැවත පරීක්ෂා කරන්න කියලා ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හැබැයි එකක් තියෙනවා. ඔබතුමාගේ සහෝදරයා එක්ක එහෙම කිවුවා නම් එතුමා මේ දන්න සියලු මන්ත්‍රීවරුන්ට කතා කරනවා. අසාධාරණයක් වෙන නිසා එතුමට අයිතිය තියෙනවා දන්න හැමෝටම කියන්න. මොකද හේතුව ඔබතුමාගේ මස්සිනාම තමයි මේකේ මුල් ආරම්භයේ හිටියේ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අඩුපාඩුකම් කීපයක් ඒකේ වෙලා තියෙනවා. විරෝධතා ඉදිරිපත් වෙලා නෑ. ඉදිරිපත් වුන විරෝධතා යට ගිහින් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවුද යට ගහලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දන්නේ නෑ. මොකද හේතුව දන්නේ නෑ. කොමසාරිස්තුමා පවා එවලා තියෙනවා. විරෝධතා සැලකිල්ලට ගන්න කියලා. ඒක නොදැනුවත්ව වෙනම ක්‍රියාවලියක් ගිහින් තියෙනවා. ඒක නිසා ඒකට අපි ස්ථානීය පරීක්ෂණයක් කරලා මන්ත්‍රීතුමා ඔබතුමාට ඊට විරෝධතා ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හැබැයි මේක නරක පූර්වාදර්ශයක්. 2013 ගනිපු තීන්දුවක් මේක.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ස්ථානීය පරීක්ෂණයක් කරමු. ඔබතුමාට පුළුවන් විරෝධතා ඉදිරිපත් කරන්නත්.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා විරෝධතා ඉදිරිපත් කරන්න. එතකොට ඒකට ක්‍රියාමාර්ගයක් ආරම්භ වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමත් ඉඳපු සභාවක ගනිපු තීන්දුවක් මේක.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක ඔතනින් එහාට කතා කරලා තේරුමක් නෑ. අපි ස්ථානීය පරීක්ෂණය කරලා ඉදිරි ක්‍රියාමාර්ග ගමු. මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

14. මහ හපුගල - ගොඩවත්ත මාර්ගයට සම්බන්ධ අතුරු මාර්ගයේ (කාන්තා පල්ලිය අසල) කොටසක් (මීටර් 75 ක් පමණ ) කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කර ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම ( ඉන්දික විජයවික්‍රම ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා මගින් මහ හපුගල ගොඩවත්ත ප්‍රදේශවාසීන්)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔය යෝජනාව ප්‍රදේශයේ අයගේ ඉල්ලීමක්. ඒක ඉතා කුඩා කොටසක්. මීටර් 75 ක් වගේ. ඒ ප්‍රමාණය භාවිතා කරන, පදිංචි අය සහ දහම් පාසලක් තියෙනවා, ඒකේ ළමයි යන පාරක්. ඒක කොන්ක්‍රීට් කරලා දෙන්න. වතුර පාරට හෝදා ගෙන යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරි යවලා ස්ථානීය පරීක්ෂණයක් කරලා ඉදිරි ක්‍රියාමාර්ග ගන්න යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පැන් සංග්‍රහය සඳහා සභාව කල් තබන ලදි)**

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u>** - නැත

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා පොඩි කාරණයක් තියෙනවා. පහුගිය සභා වාරයේදී කල් තියපු යෝජනාවක් තියෙනවා මගේ. ඒ යෝජනාව අරගෙන කතා කරමු.

ගියවර සභාවේදී මම හදිසි කටයුත්තකට පිටව ගිය අවස්ථාවේදී තමයි ඒ යෝජනා ටික ඇවිත් තිබුනේ. ඒ සභාවේ මම යෝජනාවක් හැටියට ගෙනාවා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමන්ලගේ හා මන්ත්‍රීතුමියන්ලාගේ මාසික ඉන්ධන දීමනාව රු. 8,000.00 දක්වා වැඩි කිරීමටත්, දුරකථන දීමනා රු. 5,000.00 දක්වා වැඩි කිරීමට.

ගමේ ප්‍රාදේශීය මන්ත්‍රීවරයා කියන්නේ මහජනතාව එක්ක ගමේ මංගල්ලයට, අවමංගල්‍යයට, ගමේ විහාරස්ථානයේ වේවා පාසලේ වේවා හැම කටයුත්තටම කටයුතු කරන ක්‍රියාකාරීව දායකත්වය

දක්වන පුද්ගලයෙක් හැටියට දවසකට ඉතා විශාල මුදලක් වියදම් වෙනවා. ඒ නිසා මා කල්පනා කරා මොකද පෞද්ගලිකව මම අද මේ ශාරීරික වශයෙන් අපහසුතාවයට පත්වෙලා තියෙද්දී මට දවසකට ත්‍රීරෝද රථයකට යන වියදම බැලුවම, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් මහජන සේවය උදෙසා කරන කැපවීම බැලුවම ඇත්ත වශයෙන්ම ඉන්ධන හා දුරකථන දීමනාව වැඩිවිය යුතුයි කියන යෝජනාව මම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

මොකද පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට ලැබෙන වරප්‍රසාද හා දීමනා එක්ක සංසන්දනය කරද්දී, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට ලැබෙන වරප්‍රසාද හා දීමනා එක්ක සංසන්දනය කරද්දී ප්‍රාදේශීය දේශපාලනඥයෝ හැටියට අපි ගමේ වුවමනාවන් සඳහා කැපවීම් කරන කොට යම් යම් පරිත්‍යාග හා වියදම් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා සතුව තියෙනවා. මා කල්පනා කරේ අපි ගමේ පාසල් ක්‍රීඩා උත්සවය වේවා, පෙර පාසල්, වාර්ෂික ත්‍යාග ප්‍රධාන උත්සවය වේවා, මල ගෙදර, දාන ගෙදරට යන වියදම් බැලුවම අනිවාර්යෙන්ම මේ දීමනා දෙක පමණක් නෙමෙයි, මාසික දීමනාවත් වැඩි කළ යුතුයි කියන යෝජනාව මම මේ සභාවට කරන්න කැමතියි. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනාම හිතුමතේ යෝජනා ගේනවා. කිසිම පක්ෂයකින් විවේචනයක් තියෙනවද බලන්න. ඒයෙත් වැඩි කරා. කිසිම පක්ෂයකින් විවේචනයක් නෑ. එයාලගේ සුබ විහරණය සඳහා සියල්ල කර ගන්නවා. පළාත් සභාවේ යෝජනා ගෙනල්ලා වැඩි කර ගන්නවා. ගමේ පොදු මහජනතාව එක්ක ඉන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා ඉන්ධන දීමනාව, දුරකථන දීමනාව වැඩි කරද්දී ජනතා විමුක්ති පෙරමුණ උඩ පැනලා විරුද්ධ වෙලා තියෙනවා. සාධාරණ හේතුවක් නෑ. ඒගොල්ලන් දන්නවා මේක වැඩි කළ යුතුයි. ඉන්ධන දීමනාවයි, දුරකථන දීමනාවයි ගන්න දාලා තිබුණා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු. මෙතුමලා මුකුත් ගත්තේ නැති විදියට කතා කරන්නේ. අඩුගානේ ඒ ඉන්ධන දීමනාව, දුරකථන දීමනාව, මාසික දීමනාව සභාවේ පොදු ගිණුමට ඇතුලත් කරන්න ඕන ඒගොල්ලන් ප්‍රතිපත්තිගරුක නම් අපි දීමනා නැතිව මහජන සේවයට කැප වෙනවා කියලා. ඉන්ධන දීමනාවයි, දුරකථන දීමනාවයි ආවා පහුගිය මුදල් කමිටුවේදී. මම තමයි කිවුවේ ඒක එතුමට වැරදීමකින්ද දන්නේ නෑ දාලා තියෙන්නේ. මහා ගුණවන්ත, ප්‍රතිපත්තිගරුක මන්ත්‍රීවරු ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණේ. මම කිවුවා ඒක වැරදීමකින් දාලා තියෙන්නේ. එතුමා එක්ක සාකච්ඡා කරලා ඒකට ක්‍රියාමාර්ග ගමු කියලා මම කිවුවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒක වැරදීමකින් වෙන්න පුළුවන්. එතුමා ගන්නේ නෑ කියලා පසුගිය සභාවේදී ප්‍රකාශ කරා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එතුමා ගන්නේ නෑ කියලා මහ උස් හඬින් ප්‍රකාශ කරේ. මම වාර්තාවෙත් දැක්කා. ඊට පස්සේ එනවා මුදල් කමිටුවට වවුචර් ටික.

ගිය සභාවේදී කල් තියපු යෝජනාව මම නැවත සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ආපහු ෆුල්ටොස් එකක් දානවා. මම හිතන්නේ මේක ඒ තරම් අරන් කතා කරන්න දෙයක් තිබුනේ නෑ. එදා ඔබතුමා කිවුවා අපේ තියෙන ආදායමක් එක්ක, සභාවේ සභිකයන්ට දීමනා වැඩි කරන එක සාධාරණ නෑ කියලා. අපි හරි පැහැදිලිව කිවුවා. මෙතුමා චෝදනා කීපයකුත් එක්කම ඉදිරිපත් කරන හින්දා පොඩි පැහැදිලි කිරීමකුත් එක්ක කතා කරන්න ඕන. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විතරක් නෙමෙයි පළාත් සභාවේ, පාර්ලිමේන්තුවේ හිටපු කාලේ ඇමතිවරු පවා මේ දීපු දීමනා කිසිවක් පෞද්ගලික පරිහරණයට ගත්තේ නෑ.

අපිට පෞද්ගලික පරිහරණයට මුකුත් හම්බ වෙන්නේ නෑ. බොහොම පැහැදිලිව ස්වෙච්ඡාවෙන්ම අපි අපේ මේ සේවාව කරන්නේ. හෙට දවසේ මේ රටේ සමාජ, ආර්ථික ක්‍රමයක් හැදීමේ අරමුණෙන්. මේක නැත්නම් අපි අපේ බඩ රස්සාව බවට පත්කර ගන්නවා. අපි මේ සංස්කෘතිය වෙනස් කල යුතුයි. අපි මේ මුදල් එකතු කරලා පොදු අරමුදලක් හදලා පොදු සේවා කරලා තියෙනවා. ඉදිරිපත් කරලත් තියෙනවා සමාජයට ඉස්සරහට ගිහිල්ලා. වෙන මුකුත් ඕන නෑ. මේ ප්‍රදේශයේ සියලුම පෙර පාසල් වලට කරපු රාත්‍රී කඳවුර ඒ අපේ මන්ත්‍රී වැටුප් වලින් කරේ. ඒවා මට පමණක් නෙමෙයි. රටපුරා ඉන්න ජනතා විමුක්ති පෙරමුණේ සියලුම නියෝජිතයින්ට පෞද්ගලිකව වැටුප් විතරක් නෙමෙයි. තේ සල්ලිවත් හම්බ වෙන්නේ නෑ. අපි මේ යෝජනාව දැනුත් තරයේම ප්‍රතික්ෂේප කරනවා. මේ වෙලාවේ ඔබතුමාට පැහැදිලිව කිවුවා. අපිට වෙන් කරපු මුදලින් 12% ට වැඩි ප්‍රමාණයක්, ලක්ෂ 35 ක විතර මුදලක් වාර්ෂිකව ඕන වෙනවා මේ දීමනාව ලබා දීම සඳහා. ඒක නිසා මේක සාධාරණද කියලා කල්පනා කරන්න ඕන. මෙතුමන්ලා කියනවා සභා අරමුදලට යොමු කරන්න කියලා. අපි යෝජනා කරනවා පුළුවන් නම් අවුරුදු 02 ක් වැඩ කරන්න එන්න නොමිලේ. සභා අරමුදලට දීමනා ටික බැර කරලා ඔබතුමාලා වැඩ කරන්න. හරිම පැහැදිලියි කාරණාව. අපි කියන්නේ රටේ මිනිස්සු ජීවත් වෙන අමාරුව අපි කාටත් දැනෙනවා. අපිටත් දැනෙනවා අමාරුකම්.

අපි මේ කරන්නෙත් කැප කිරීමක්. ඒ කැප කිරීම මේ මොහෙතේ කරන එක සාධාරණයි. අතිශය සාධාරණයි. මේ සභාවේ මිනිස්සු මීට වඩා කරනවා. අපි මාසෙකට දවසයි එන්නේ. සභා බල ප්‍රදේශය පුරා ගමන් කරන එක ඇත්ත. ඒ එකක්වත් මම කියන්නේ නෑ, නෑ කියලා. මන්ත්‍රීවරු හැටියට අපි යෝජනා ගෙනල්ලා යම් මැදිහත්මක් කරන එකක් ඇත්ත. අපිට තියෙන අමාරුකම් සභාවේ අරමුදලින් විසඳගන්න යන එක සුදුසු නෑ. ගරු සභාපතිතුමනි, ඔබතුමා ඒ වෙලාවේ ඒ තීන්දුව ගත්තා. මම ඒවෙලෙත් කිව්වා. මේක තාවකාලික නෙමෙයි සුදුසු නෑ කියලා කොහොමත් යෝජනා කරන්නත්. සභාව අපහසුතාවයට පත්කර ගත්තේ ඔබතුමාලමයි. ඔබතුමාලා මෙවැනි යෝජනාවක් මේ තත්වය තුළ මෙතනට ගේන එක සුදුසුත් නෑ. අපි ඒකට එකඟ වෙන්නේ නෑ කොහොමත්. අපි අපේ ක්‍රමය ඇතුලේ කියලා තියෙන්නේ. දවසක ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවක් එනවා නම් සියලුම මන්ත්‍රීවරුන්ගේ වැටුප් වෙන්නේ පුහුණු කම්කරුවෙකුගේ වැටුප. එතනටයි යෝජනා කරන්න ඕන. ඒ නිසා ඔබතුමාට කියනවා මේ යෝජනාව නැවත ගන්න එපා කියලා. මේ යෝජනාවට මම විරුද්ධ වෙනවා. අපි යෝජනා කරනවා ඉන්ධන හා දුරකථන දීමනා වැඩි නොකර සේවකයන්ගේ පඩි වැඩි කරන්න. ඒ මිනිස්සුයි වැඩ කරන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගිය සභාවේදී ඒ යෝජනාවට පක්ෂව කතා කරා. මහ නගර සභාවේ, ප්‍රාදේශීය සභාවේ ඉන්න ඔක්කොම පළාත් පාලන මන්ත්‍රීවරු, නගර සභාවේ මන්ත්‍රීවරුන්ගේ ඉන්ධන දීමනාව රු. 8,000.00 යි. දුරකථන දීමනාව රු. 8,000.00 යි. නගර සභා බල ප්‍රදේශය පොඩියි. අපිට මහ ලොකු බල ප්‍රදේශයක් තියෙන්නේ. විෂමතාවයක් තියෙනවා එතන. ඔක්කොම පළාත් පාලන මන්ත්‍රීවරු. අපි හොරකම් කරන්නේ නෑ. මංකොල්ලා කන්නේ නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මටත් මේ ඉන්ධන දීමනාව ගැන අදහසක් දක්වන්න ඕන. මොකද මන්ත්‍රීවරයෙක් හැටියට මටත් ලොකු වියදමක් යනවා මේ දේශපාලන කටයුතු සිදු කිරීමේදී. මට විතරක් නෙමෙයි මේ සියලු මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට පොදු වැඩ කරද්දී ලොකු වියදමක් දරන්න වෙනවා. සමහර විට මඟුල් ගෙදරකට ආරාධනා කරන්න පුළුවන් පොල්තෙල් පහන දල්වන්න ආරාධනා කරන්න පුළුවන්. උත්සවේ සමාරම්භක අවස්ථාවට ආරාධනා කරන්න පුළුවන්. කඩයක් විවෘත කරන එකකට ආරාධනා කරන්න පුළුවන්. මේ හැම කටයුත්තටම සමහරවිට කොටහලු මඟුලක් වුනත් වෙන්න පුළුවන්. ඒ මන්ත්‍රීවරයාගෙන් බලාපොරොත්තු වෙනවා එතනදී යම්කිසි මුදලක්. එතනදී අපිට රු.2,000.00, රු.3,000.00, රු.5,000.00 වශයෙන් යම්කිසි මුදලක් පිරිනමන්න වෙනවා. එතනදී ඉතා අසරණ තත්වයට පත්වෙනවා අපි. අපිට මේ වගේ උත්සව අවස්ථා මාසෙකට 20 ක් 30 ක් ආවොත් රු.2,000.00 ගානේ තියලා බලන්න කීයක් යනවද කියලා. මට ගිය මාසෙ රු. 100,000.00 ක විතර වියදමක් දරන්න වුනා. මගේ ඩයරියේ ලියලා ඇති බලන්න පුළුවන්. උත්සව වලට සහභාගී වුන හැටි.

ඉන්ධන දීමනාව අපිට ලැබෙන්නෙ රු. 3,000.00 මට ගිය මාසෙ රු.50,000.00 කට අධික ඉන්ධන වියදමක් දරන්න සිදු වුනා. ගමන් යන්න වුනා විවිධ කටයුතු වලදී. රු.3,000.00 ක් විතර යනවා හදිස්සියෙන් කොළඹ යන්න සිදු වුනොත්. ඒ කටයුතු වලදී අපිට සමාජ සේවය කරද්දී මුදල තීරණය කරන්න බෑ. මිනිස්සු අපෙන් බලාපොරොත්තු වෙනවා යම්කිසි මුදලක් උත්සවයකට සහභාගී වුනාම. ඒක ඉටු කරන්න ඕන. නැත්නම් කියයි මන්ත්‍රීතුමා ලෝභකමට කිසි දෙයක් දුන්නේ නෑ අපේ උත්සවේට ආවා කියලා. අපේ JVP එකේ මන්ත්‍රීතුමා කිව්වා මේ මුදල් අපිට වැඩක් නෑ කම්කරුවෙක්ට දීලා මේ මන්ත්‍රීධූරයේ වැඩ කටයුතු කරන්න පුළුවන් කියලා ඔබතුමාගෙන් අහන්න කැමතියි සභාවේ වැඩ එහෙම කරන්න පුළුවන්ද කියලා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මතු වුන ගැටලුව පිළිබඳ අදහසක් දක්වන්න ඕන. ඇත්තටම පිළිගන්න ඕන කාරණා තමයි මන්ත්‍රීවරු බොහොම අපහසුවෙන් ඉන්නේ. මන්ත්‍රීවරුන්ට බොහොම සීමිත දීමනාවක් ලබා දෙන්නේ. ඒ දීමනාවත් දෙන්න ගත්තේ බොහොම මෑතක ඉඳන්. ඉන්ධන දීමනාවයි, දුරකථන දීමනාවයි මීට කලින් දුන්නේ නෑ. ඒ කෙසේ වෙතත්. අපිට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විදියට වගකීමක් තියෙනවා. අපිට මිදෙන්න බෑ ඒකෙන්. අනිත් ප්‍රාදේශීය සභා ගැනත් හිතන්න ඕන. අපිට බෑ වෙනම වැඩි කරගන්න. හබරාදුව කියන්නේ හොඳටම ආදායම් තියෙන ප්‍රාදේශීය සභාවක්. අපිට බෑ ඒවා ඉක්මවලා යන්න. මෙතන ගැටලුවක් තියෙනවා. මම හිතන්නේ නෑ යෝජනා ස්ථිර කරලා යැව්වත් අපිට මේක වැඩි කරලා දෙයි කියලා. අපි වෙනම පණිවිඩයක් දෙනවා මන්ත්‍රීවරුන්ට මෙහෙම මුදල් වැඩි කරන්න කියලා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ එහෙම දෙයක් බිල්ලට දෙන එක තමයි මේ වෙන්නේ. ඉතින් ඒක තුළ ජනතා විමුක්ති පෙරමුණ ප්‍රාදේශීය සභා වල විතරයි මෙහෙම කතා කරන්නේ. ඉහළ අය ඉන්න අය ඉන්න පවතින

රජයත් එක්ක වචනයක්වත් කියන්නේ නැනේ. හිර කරලා තියෙනවා ප්‍රාදේශීය සභා වගේ පහළ මට්ටම ගමත් එක්ක ඉන්න හින්දා. ඉහළ අය වෙනසක් නෑ අනිත් පක්ෂත් එක්ක ගත්තම. බොහොම පැහැදිලි වැඩපිළිවෙලක ඉන්නේ. අපි දැක්කා පහුගිය කාලේ යම් යම් තැනැත්තෝ ආරක්ෂා කර ගන්න ගෙන ගිය වැඩපිළිවෙල. ඉතින් ඒක තමන්ගේ පැවැත්ම සඳහා ඉහළ අය කරනවා. පහළ අය වෙනත් මතයක් දරනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉඳපු මතයේ අදත් ඉන්නවා. මේ යෝජනාව අයින් කරනවා. න්‍යාය පත්‍රයට මේක ඇතුල් කරලත් නෑ. එහෙම නම් යථා පරිදි කල් දී ඇති යෝජනා වලට ඒක දානවා. ඒක එහෙම ආවේ නෑ. ප්‍රතිපාදන නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගැටලු රාශියක් තියෙනවා. ඒක අයින් කරනවා. ගිය සභාවෙත් නැවැත්තුවා. මේ සභාවෙත් නැවැත්තුවා. මෙතුමා හිටියේ නෑ. ඒ නිසා ඉදිරිපත් කරා. ඒක සාධාරණයි. ගැටලු සහගත තැන් තියෙනවා මට සභාපතිවරයා විදියට. අනිත් සභාවල නොකරන කොට මේ සභාවෙන් යවලා මිනිස්සු ඉදිරියේ සභාව අපහසුතාවයට පත්කරන්න මට බෑ. බෝපෙ පෝද්දල සියලු මන්ත්‍රීවරු හැල්ලුවට ලක් කරන්න මට බෑ. යන්නේ වැරදි අදහසක්.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභා වාර්තාවේ තියෙනවා. මේ සම්බන්ධව මන්ත්‍රීවරු අපහසුතාවයට පත් කරන්නේ නෑ. යෝජනා ගෙනාපු උපසභාපතිතුමත් දැන් නැති නිසා යෝජනාව ඊළඟ සභාවට කල් දානවා කියලා. දැන් මේක ගේන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක මේ යෝජනාව ගේන්න සුදුසු වාතාවරණයක් නෙමෙයි. අපිට මහජනතාව වෙනුවෙන් සේවය කරන්න වෙන්න වරිපනම් මුදල් වලින්. අපි ඒ කැපකිරීම කරමු උපසභාපතිතුමා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මම ගිය සභා වාරයේදී යෝජනාවක් ඉදිරිපත් කරා. අපි ගමේ ජනතාවගේ ඡන්දෙන් පත්වෙලා ඒ ජනතාවට සේවය කරන්න කැපවුනු කොටසක්. මේකට විරුද්ධ වුන ජනතා විමුක්ති පෙරමුණට ගමේ පාක්ෂිකයෙක් නැනේ. දවසකට එහෙම සමබන්ධ වෙන්න කෙනකුත් නෑ. එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, පොදු ජන පෙරමුනේ අපිට ජනතාව කරුණු කාරණා එනවා. ඒකට සම්බන්ධ වෙන්න අපිට යම් මුදලක් වැය වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මේකට ඡන්දයක් විමසුවේ නෑ. තව විරුද්ධ අය ඉන්න පුළුවන්. JVP එකේ අය විතරක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක තමයි සභාපතිතුමා ගිය සභාවේදී අපි කිවුවේ බෙදීමක් දෙන්න කියලා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා එක්ක මම මේ ගැන සාකච්ඡා කරා. මතක තියා ගන්න මිනිස්සුන්ට සේවය කරන්න අපිට අවශ්‍යයි. මිනිස්සුන්ගේ ප්‍රශ්න වලට නිතර නිතර උත්තර දෙන්න ඕන. ජනතා විමුක්ති පෙරමුනේ මන්ත්‍රීවරු තදබල විවේචන කරාට එතුමලට ගමේ ප්‍රශ්න එන්නේ නෑ. එතුමලට තියෙන්නේ දවස ගෙවන්න මොකක්හරි විවේචනයක් කරන්න විතරයි. කිසිදේකට මේ රටේ හොඳක් නොකියපු එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ. ගරු සභාපතිතුමා මට කරපු ඉල්ලීම අනුව ඒ යෝජනාව මම ඉල්ලා අස් කරගන්නවා. මේ ආර්ථිකය යහපත් වුනාම ඒ යෝජනාව ඔබතුමාගෙන් ගේන්න ජනතාවට සේවය කරන්න ඒ වරප්‍රසාද මහජන නියෝජිතයින්ට ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳව උපසභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. මොකද හේතුව අපිට වර්තමානයේ ප්‍රාදේශීය සභාවට ආණ්ඩුවෙන් රුපියලක්වත් එන්නේ නෑ. සම්පූර්ණයෙන් ප්‍රාදේශීය සභාව ගෙනියන්නේ වරිපනම් මුදල් වලින්. සංවර්ධන ක්‍රියාවලි සඳහා අපිට රජයෙන් ලැබෙන්නේ නෑ. අපි මිනිස්සුන්ගේ බදු වලින් තමයි සභාව ගෙනියන්නේ. අපිට ඒ

කිවුවා වගේ යහපත් පරිසරයක් ක්‍රියාත්මක වෙලා මිනිස්සුන්ට මීට වඩා වැඩි සේවයක් ක්‍රියාත්මක කරන්න ලැබුනොත් ඒ පිළිබඳව සලකා බලමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, කරුණා කරලා පැහැදිලි කරලා කියන්න වෙනදා සභාවට සංවර්ධන වැඩ කටයුතු සඳහා සල්ලි වෙන් කරනවද මධ්‍යම රජයෙන්?. මධ්‍යම රජයෙන් මීට කලින් සල්ලි එවලා තියෙනවද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රේඛීය අමාත්‍යංශය හරහා එවනවා. පළාත් සභාවෙනුයි දෙකෙන්ම එවනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවට පඩි ගෙවන්න සල්ලි එවන්නේ මධ්‍යම ආණ්ඩුවෙන්. මන්ත්‍රීවරුන්ට දීමනා ගෙවන එක ලොකු අපහසුතාවයක් නෙමෙයි. ගෙවන කොට මුලු ලංකාවටම ගෙවනවා. අපි අර යෝජනාව ක්‍රියාත්මක කරලා සභාවෙන් ගෙවන්න කියන්නේ නෑ. අපි මේ යෝජනාව යැවුවා කියලා එකපාර ආපේ සභාවට විතරක් ගෙවන්නෙත් නෑ. ඉන්ධන දීමනාවයි, දුරකථන දීමනාවයි අපේ සභාවට විතරක් ගෙවන්නේ නැනේ. මුලු ලංකාවටම දෙනවා. ඒ හින්දා අපි යෝජනාව යවමු. ක්‍රියාත්මක වෙනකොට ලංකාවටම ක්‍රියාත්මක වේවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා ඒ යෝජනාව ඉල්ලා අස්කර ගත්තා. අපි ඒ යෝජනාව ගැන කතා නොකර ඉමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඉතාම කරුණාවෙන් ඉල්ලනවා. මම කවදාවත් සභාවකදී මෙහෙම කලින් ගිහින් නෑ.  අද දවසේ මට පිටව යන්න ඕන කියා කරුණු 02 ක් ඉදිරිපත් කරලා යන්න අවසර දෙන්න න්‍යාය පත්‍රයට පිටින්. ඒ ගැන සමාවෙන්න ගරු සභාපතිතුමනි. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා නැවත වරක් මතක් කරනවා. අනවසර ඉදිකිරීම් හා අනවසර ගොඩකිරීම් පිළිබඳව වහාම තීන්දුවක් ගන්න. මේ ලබන මාසේ වෙනකොටත්. මේ දීලා තියෙන ප්‍රගතිය වැඩක් නෑ. කවුරුත් දන්නවා ඕක. පාරක් හැදුවා කියලා ප්‍රගතියට දාලා දීලා වැඩක් නෑ. දැනටත් ඊරියගහ හන්දියේ කැඩුණු තාප්පය පිළිසකර කරගෙන යනවා. සියලුම මන්ත්‍රීවරුන් ඉල්ලනවා මේක ගිහින් බලන්න. විශේෂයෙන් චමින්ද මන්ත්‍රීතුමාගෙන් ඉල්ලනවා. මේක නිවැරදිව බලන්න.

ඊළඟට මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා දැන් බලන්න මේ කෙරෙන දේවල්. වෙන්දේසි ඉඩම් සඳහා. කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ ඉඩම වෙන්දේසි කරන්න හෝම් ලෑන්ඩ් කොම්පැනි එකට යනකොට නාගරික සංවර්ධන අධිකාරියේ හොර ගුහාවෙන් කියලා නෑ NBRO රිපෝට් එකක් ගේන්න කියලා. අක්කර 03 ක ඉඩමක් විනාශ කරලා තියෙනවා. අර රොස්වුඩ් එකේ ඉඩමත් එහෙමයි. තියෙන්නේ මධ්‍ය අවදානම් කියලා. දැන් කපලා කොටලා දානවා. මේවට මුකුත් නෑ. මධ්‍යම පරිසර අධිකාරිය තියෙනවා මුකුත් කරලා නෑ. මොනවටද මේවා තියෙන්නේ. මේවාට නෑ පරිසර අධිකාරියෙන් සහතිකය ගේන්න කියලා. කන්න ඕන වුනාම කන්න ඕන පිළිවෙලට තමයි ඕක කරන්නේ.

ඔබතුමා දිගින් දිගටම දැනුවත් කරා. මම දැනුවත්වම දුන්නා දහනායක හාඩ්වෙයාර් එක. ඒ අය බලහත්කාරයෙන් තමයි සියලු තැන් වල හැසිරෙන්නේ. ලීඩ්ස් ඉන්ටර්නැෂනල් එක, දසනායක එක මේ වගේ ප්‍රධාන කීපයකට නඩු දාන්න ඔබතුමාලාට වෙන අපහසුතාවයක් තියේනම්, අපි සභාවට විරුද්ධව හරි නඩු දානවා. මේක පටන් ගැනීමක් වෙන්නේ නෑ. කොහෙන් හරි පටන් ගන්න ඕන. මේක දැන් බලන්න ACCESS ඉඩමේ බටුවන්තුඩාව පන්සල ඉස්සරහා ගෙයක් හදලා තියෙනවා. නීතියක් තියෙනවා පර්චස් 10 ක ඉඩමක් තියෙනවා මේ ගේ හදන්න පුළුවන් පර්චස් 06 ක. ඒ ගේ මුලු ඉඩමම ගහලා කවුද අනුමත කරලා තියෙන්නේ. මේක සිද්ධ වෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන් එන නිලධාරියා මේක කනවා. අපේ නිලධාරිනුත් යට කරලා දාලා. අන්තිමට ට්‍රාන්සර් කරනවා මාස 07 ක් 08 ක් ගියාම. දැන් VC පාරේ ෆයිල් එකක් නැතිවෙලා තිබුණා. දැන් ඒක තියෙනවා. ඒ පිළිබඳ ගන්න තීන්දු තීරණ.

විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි, මේක පොදු වස්තුවක්. එදා ගිහින් බොහොම පැහැදිලිව දැක්කා නන්දිමිත්‍ර විද්‍යාලය. එදා අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට සභාවේ යෝජනාවක් සම්මත කරල යවලා ඒ පරීක්ෂණ කරා. ඒ පරීක්ෂණ කරලා නීතිපති දෙපාර්තමේන්තුවට ඇරියා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණයක් කරලා ඒක වැඩක් නැත්නම් ඒක අහක දානවා. නීතිපති දෙපාර්තමේන්තුවට යවන එකේ තේරුම තමයි නඩු

නිමිත්තක් තියෙනවා. ඒ නිසා නඩු නිමිත්ත අනුව නඩුවක් දාන්න කියලා යැවුවේ. තාම ඒකට නීතිපති දෙපාර්තමේන්තුවෙන් මුකුත් ඇවිත් නෑ. ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා මේක පහු කරන්න එපා. වහාම නීතිපති දෙපාර්තමේන්තුවට අහලා යවන්න. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අහලා යවන්න මොනවද ගනිපු ක්‍රියාමාර්ග කියලා. අද දවසේ විශේෂ අවධානය යොමු කරලා මේ දේ කරන්න. මට අද දවසේ කතා කරන්න ගොඩක් දේවල් තිබුණත් යන්න අවසර දෙන්න.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

(සභාව පැහැදිලි නොවීය)

<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 01. රොස්වුඩ්වත්ත බෝක්කුව ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. මවුන්ට්ප්ලසන්ට් වත්ත පාර හරස් මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. සිල්වගේවත්ත මාර්ගය සංවර්ධනය කිරීම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. මවුන්ට්ප්ලසන්ට් වත්ත පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. ආරච්චි කන්ද - නාරංගහ දොලගාවවත්ත, සව්සිරි මාවත, 02 වන පටුමග කාණු පද්ධතිය සමඟ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 06. මල් මාවත, දොල කාණුව මුල් කොටස කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒක හැබැයි සභාපතිතුමා දීර්ඝකාලීන ගැටලු තත්වයක් තියෙන දොළ කාණුවක්. ඉක්මනින්ම ඒක කරලා දෙන්න දෙපාර්ශ්වයම එකඟ වෙලා තියෙනවා ඒකට. පුළුවන් තරම් ඉක්මනට ඒක ඊළඟ කර්මාන්ත කමිටුවට දාලා දෙන්න ඇස්තමේන්තුවක් සකස් කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 07. මල් මාවත, දොළ කණුව ප්‍රධාන වෙල්යාය දක්වා ඒක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදවා සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මොකද වෙල් යාය මැද වතුර බැස යන්නේ නෑ. පැයක් හමාරක් වැස්සම සම්පූර්ණයෙන් යට වෙනවා. ඉක්මනටම ඕකත් කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 08. කපුහෙම්පල, ගොඩදූව මාර්ගයේ කිවිලදූව අසල මාර්ගයේ කාණු එක්ස්කැවේටර් යන්ත්‍රයත් යොදවා සුද්ධ පවිත්‍ර කොට නිවෙස් වලට පිවිසෙන ස්ථාන සඳහා අවශ්‍ය සිලින්ඩර් යෙදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම සිථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මීටර් 200 ක් විතර කාණුව කපන්න තියෙනවා. ලොකු මුදලකුත් සභාවෙන් වැය වෙනවා. ඒ කාණුව කැපුවේ නැත්නම් වැස්සට සම්පූර්ණයෙන් පාර යට වෙනවා. කලිනුත් ඒ ගමෙන් ඔබතුමාටත් දැනුම් දීමක් කරලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 09. පලිවතුගොඩ, ගල්පොත්ත පොළ කාණුව එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදවා සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇස්තමේන්තු සකස් කරලා ඔබතුමාගෙන් ප්‍රතිපාදන වලින් තමයි කරන්න වෙන්නේ. නිවෙස් වලට පිවිසෙන ස්ථාන සඳහා සිලින්ඩර් දාන්න අපිට සභාවේ මුදල් යොදවන්න බැරිවෙයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අපේ සභාවෙන් නඩත්තු කරන්නේ. සභාව සතු කාපට් පාරක් ඒක. කාණුව කැපුවොත් අපිට කරන්න බැරිද?. ඒ කාපට් එක සවුත්තු වුනොත් ලොකු මුදලක් වැය කරන්න වෙයි ඉදිරියේදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඇස්තමේන්තුවක් එක්ක හදන්න වෙනවා එහෙනම්. එක්ස්කැවේටර් එකෙන් කාණු කපන්නයි, සිලින්ඩර් දාන්නයි දෙකම එක ඇස්තමේන්තුවට හදන්න වෙනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒක කරන්න වෙනවා සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දෙන ප්‍රතිපාදන ප්‍රමාණය තුළ ඒක බැලන්ස් කරගන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, 2011 දී වුණ ගැටලුවක් මේක. නරාවල අද්දරගොඩ වත්ත මාර්ගය අපි පහුගිය කාලේ සංවර්ධන කටයුත්තක් කරද්දී ඉඳපු සභාපතිතුමා චානක මාදුගොඩ මැතිතුමා, තාක්ෂණ නිලධාරීන් ගිහින් පාරේ අවහිරතාවයක් ඉවත් කරා. ඒකට නඩුවක් ගොනු කරා අදාල පාර්ශ්වය. ඒකට අපිට ඇවිල්ලා තියෙනවා අද. මෙම නඩුව සඳහා 2019.02.21 දිනට පෙර උත්තර සපයන්න කියලා සභාවෙන්. ඒක සභාවට ආවද දන්නේ නෑ. ඒ හින්දා ඉක්මනින් උත්තර සපයන්න කියලා මම යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** 10. පියදිගම ජනක වසන්ත රණවිරු මාවත ඉදිරිපිට ඇති විදුලි කණුව එම ස්ථානයෙන් ඉවත් කර වෙනත් ස්ථානයක සිටුවීම සඳහා සී/ස ලංකා විදුලි

(පුද්ගලික) සමාගම මගින් ලබා දී ඇති ඇස්තමේන්තු මුදල වන රු.19,435.00 ක මුදල සභා අරමුදලින් ගෙවීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** 11. අප ප්‍රාදේශීය සභාවට ලැබෙන විනෝද බදු මුදල් නැවත නිදහස් කිරීම නිසා විශාල පාඩුවක් සිදු වන බැවින් මින් ඉදිරියට විනෝද බදු මුදල් නිදහස් නොකිරීමට යෝජනා කරමි.

මේ කාරණය ගැන අපි දිගින් දිගටම කතා කරා. මම මේ යෝජනාව කරන්නේ සභාවට සභාවේ කවුරුත් කතාබහ කරලා යම්කිසි තීරණයක් ගන්න. මම අපේ බල ප්‍රදේශයේ තුළ ආයතන වලට පාසල් වලට විනෝද බදු මුදල් නිදහස් කිරීමට විරුද්ධ නෑ. නමුත් බල ප්‍රදේශයෙන් පිට පාසල් වලට ආයතන වලට නිදහස් කරනවට මම විරුද්ධයි. ඒකට හේතුවක් තමයි මේ කවුරුත් එකඟවෙයි. මේ අපේ සභාපතිතුමා, උපසභාපතිතුමා, මන්ත්‍රීවරුන්ගේ ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයේ හෝ මහින්ද විද්‍යාලයේ විදුහල්පතිට කිවුවොත් ළමයෙක් ඉන්නවා ඉස්කෝලෙට ඇතුළත් කර ගන්න කියලා. ඒ ගෞරවය අපිට ලැබෙන්නේ නෑ. අපේ මට්ටමෙන් මෙහෙම කාරණයක් ආවම අපි විරුද්ධයි ඒකට.

දැන් විදුහල්පතිගාවට ගියාම අපිට එහෙම සලකනවා නම් අපි සභාවෙන් ඇයි එයාලට ඒ උදව්ව කරන්නේ. අපේ සභාවට ගරුත්වයක් නැත්නම් අපි මොකටද එහෙම කරන්නේ. එම නිසා ඒකටත් අවධානය යොමු කරනවා. ඒ යෝජනාව ගැන තමුන්නාන්සේලා කතිකා කරලා තීරණයක් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එහෙමනම් සම්පූර්ණයෙන් නිදහස් කරන්නේ නැද්ද?.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පිට විදුහල් වලින් ඉල්ලුවොත් නිදහස් කරන්නේ නැද්ද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මින් ඉහත ඔක්කොම නිදහස් කරලා තියෙනවා සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සියලුම නෙමෙයි. අදාළ විද්‍යාලයට ඒක නිදහස් කරන්නේ. දෙයක් කරනවා නම් එයාලා පාසලට, අපිට ඉදිරිපත් කරොත් විදුහල්පතිගේ නිර්දේශය, සියලුම ආදායම විද්‍යාලීය සංවර්ධන සඳහා බැර කරනවා කියලා. අපි ඒ මුදල් නිදහස් කරනවා. නැත්නම් නිදහස් කරලා නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** විද්‍යාලෝක විද්‍යාලයේ ඉල්ලීමට මොකද වුනේ?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දවස් 30 ක් පහුවෙලා. ඉල්ලීම් කරන්න ඕන දවස් 30 ක් ඇතුලත. දවස් 30 නම් 30 යි. 31 ක් බෑ. දින 30 පහුවෙලා සතියකට විතර පස්සේ ඉදිරිපත් කරේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපිට සභා තීන්දුවක් අරගෙනවත් බැරිද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම බෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඉස්කෝල වල පාසල් සංවර්ධන සමිති වල විශාල වශයෙන් මුදල් තියෙනවා. අපිට ලැබෙන ආදායම නිදහස් කරාම තමයි අපිට සල්ලි නැතිවෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විද්‍යාලයේ විදුහල්පතිතුමා ලියුමක් දෙන්නේ නෑ ඒ මුදල් විද්‍යාලයට බැර වුනේ නැත්නම්. ඒක තේරුම් ගන්න. දැන් මේකෙන් වෙන්නේ විද්‍යාලයට මුදල් දෙන්න වෙන්නේ නෑ. ඒක තේරුම් ගන්න. යම්කිසි කණ්ඩායමක් ප්‍රසංගයක් කරලා සම්පූර්ණ

ආදායම බැර කරනවා පාසලට. දරුවන්ගේ අධ්‍යාපනයට. එයාලට ඒක කරන්න වෙන්නේ නෑ අපි 100% අය කරොත්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මම කියන්නේ සුගත් මන්ත්‍රීතුමාගේ යෝජනාවට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තියෙන පාසල් වලට සහනයක් දිය යුතුමයි. හැබැයි ඔය කියන ගාල්ල නගරයේ තියෙන ජනප්‍රිය පාසල් අංගසම්පූර්ණ ඒවා. ඒ කියන විදියේ ලිපි විදුහල්පතිතුමාගෙන් ඒ අය ක්‍රමයක් හැටියට අරන් එනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ මුදල් විද්‍යාලයට මුදල් බැර වෙන්නේ නැත්නම් විදුහල්පතිතුමා ඒ ලියුම දෙන්නේ නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ සම්බන්ධව අපි ගිය අවුරුද්දේ සභා තීන්දුවක් ගත්තා. ඒකෙදී කිවුවේ 25% ක් හරි 50% ක් හරි නිදහස් කරන්න කියලා. ඒක 2019 දී ක්‍රියාත්මක කරමු කියලා යෝජනා වුනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක විධිමත් සභා තීන්දුවක් වුනේ නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සාකච්ඡා වුනා. ඒ වුනාට න්‍යාය පත්‍රයේ ආවේ නෑ. ඒක කතා වුනා විතරයි. 50% ක් නිදහස් කරන එක ගැන කතා කරා. නමුත් ඒක විධිමත් නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අද තීන්දුවක් ගත්තොත්.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** බල ප්‍රදේශයට 100% ක් නිදහස් කරලා වෙනත් ඒවට 50% ක් නිදහස් කරන්නකෝ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, මේ යෝජනාව අපි දීර්ඝව කතා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අපි මෙහෙම කරොත් ආදී ශිෂ්‍ය සංගම් වලට, විද්‍යාල වලට කීයක්වත් දෙන්න බැරි වෙනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි මේ මුදල් නිදහස් කරන්නේ පාසලට මුදල් බැර කරනවා කියන කාරණය ඇතුලේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අදාල ලියකියවිලි ගෙනාවේ නැත්නම් 100% ක් අය වෙනවා. විද්‍යාලයට උදවු නොකරොත් විතරයි 100% ට අපි අය කරන්නේ. මුදල් නිදහස් කරන්නේ සභාවට බැඳලා මාස හයක් ගියාට පස්සේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** විද්‍යාල වලට බැර වන මුදල අපි උදුරගන්න එක හොඳ නෑ. බල ප්‍රදේශයේ වුනත් අපි දෙන්නේ ඒ සියලු මුදල් පාසලට බැර වුනා කියලා විදුහල්පති දුන්නොත් විතරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් බල ප්‍රදේශයේ සම්පූර්ණයෙන් නිදහස් කරලා අනිත් ඒවම 50% ක් නිදහස් කරමු.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සියලු පාසල් වලින් ගන්න. 100% ම ගන්න පිට පාසල් වලින්.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මගේ අදහස නම් ගරු සභාපතිතුමනි, බල ප්‍රදේශය තුල 100% ක් නිදහස් කරන්න බල ප්‍රදේශයේ පිට ජාතික පාසල් වලට 50% ක් නිදහස් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම තෝරන්න බෑ. මේක තාම තේරුම් ගත්තේ නෑ. මේක නිදහස් කරන්නේ විද්‍යාලයට මුදලක් දුන්නොත් විතරයි.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ අදහසට එකඟ වෙනවා. පාසලට හිමි වෙනවා නම් ඒක සම්පූර්ණයෙන් නිදහස් කරන්න. අනිත් ඒවා 50% ක් නිදහස් කරන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මහ ඇමතිතුමත් නිර්දේශ කරලා එවනවා. එතකොට අපිට නිදහස් කරන්න වෙනවා. මහ ඇමතිතුමා නිර්දේශ කරොත් සභාවට කරන්න දෙයක් නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කැමති තීන්දුවක් ගන්න. කිසි ප්‍රශ්නයක් නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම ඉදිරිපත් කරපු යෝජනාව සංශෝධනයක් ඉදිරිපත් කරනවා. බල ප්‍රදේශයේ පාසලක විනෝද බදු මුදල් නම් 100% ක් නැවත නිදහස් කරන්න. බල ප්‍රදේශයේ සිට පාසලක විනෝද බදු මුදල් නම් 50% ක් නැවත නිදහස් කරන්න කියලා මම ඒ යෝජනාව සංශෝධනය කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

විදුහල්පතිතුමා ඒක නිර්දේශ කරලා එවන්න ඕන ඒ මුදල් විද්‍යාලයට බැර වෙනවා කියලා. නැත්නම් 100% ම අය කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** 12. අප ප්‍රාදේශීය සභාවේ කලේගාන පිහිටි ප්‍රධාන කාර්යාලයේ මගින් සිදු වන සේවාවන් ප්‍රමාණය, මීපාවල පිහිටි උප කාර්යාලය මගින් සිදු නොවන බැවින් මේ සම්බන්ධව සාකච්ඡාවට බඳුන් කර තීරණයක් ගැනීම.

මම ඒ ගෙනාවේ දැකපු දේ. කලේගානෙ තියෙන්නේ ප්‍රධාන කාර්යාලය. පෝද්දලත් තව උප කාර්යාලයක් තියෙනවා. ඒක එදා ඉඳන්ම තිබුණා. නමුත් මේ ප්‍රධාන කාර්යාලයට තමයි හැම කෙනාම හොයාගෙන එන්නේ. කපුහෙම්පල, ලබුදූව පැත්තේ අය වැඩේ කරගන්න එන්නේ මෙහාට. නමුත් යන්න ඕන මීපාවලට. ඒ හින්දා මම මේ යෝජනාව ගේන්නේ මේ සභා 02 ම එකතු කරලා ප්‍රධාන කාර්යාලය විතරක් ගෙනියන්න කියලා. එතකොට නඩත්තු ඒකකය පෝද්දලට ගෙනියන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට ඒක පැහැදිලි නෑ. ඔබතුමා කියන්නේ උපකාර්යාලයත් මෙහෙට අරන් සම්පූර්ණ කාර්යාලයම මෙහේ ගේන්න කියලද?. දුර වැඩියිනේ

පරිපාලන වැඩ වලට. මම නම් දකින්නේ පුළුවන් නම් කරාපිටිය පැත්තට වෙන්න තව උපකාර්යාලයක් හදන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම නම් කියන්නේ කරාපිටිය කොට්ඨාශය මෙහෙට සම්බන්ධ කර ගන්න. නැත්නම් ඒ අයට වැඩ පහසු කරගන්න ක්‍රමයක් සකස් කරන්න. වසම් කීපයක්වත් කපුහෙම්පලත් මෙහෙට සම්බන්ධ කරගන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතුමගේ යෝජනාව සම්බන්ධව මාත් එක්ක සාකච්ඡා කරා. ප්‍රායෝගික ගැටලුව තියෙන්නේ මේකේ සීමාවන් අඳුරගන්න බැරි නිසා කාර්යාල දෙක වරද්දගෙන යනවා කියලා. ඒක පරිපාලන ගැටලුවක්. සීමාව නිශ්චිත කර ගන්න බැරි එක. නිශ්චිතව හඳුනා ගත හැකි සීමාවන් හඳුනාගෙන ඒ සීමාවන් උපකාර්යාලයට හා ප්‍රධාන කාර්යාලයට කියලා වෙන්කර ගෙන නිශ්චිතව වැඩ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමන්ලා කියන්නේ උප කාර්යාලයට මොනවද යන්න ඕන කොට්ඨාශද, මොන වසම්ද ?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කරාපිටිය කොට්ඨාශයයි, කපුහෙම්පල කොට්ඨාශය, ප්‍රධාන කාර්යාලය ගන්න කියලා මම යෝජනා කරනවා. කරාපිටියේ මනුස්සයෙක් උපකාර්යාලයට යන්න බස් 02 ක යන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නරාවල, පෝද්දල, උළුවිටිකේ කොට්ඨාශ උපකාර්යාලයට ගන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ලබුදූව කොට්ඨාශයට මොකද කරන්නේ?.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නරාවල, පෝද්දල, උළුවිටිකේ කොට්ඨාශ 03 උපකාර්යාලයට දාමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ලබුදූව කොට්ඨාශය අයට ප්‍රධාන කාර්යාලයට පහසුයි.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වරිපනම් පිළිබඳ පරිපාලන ගැටලුවක් වෙනවා. ඕක ඉක්මනට කරන්න බැරිවෙයි. මාස 06 ක විතර කාලයක් යයි වරිපනම් ටික වෙනස් කරගන්න. බාස් වත්ත මිනිස්සුන්ට තමයි ප්‍රශ්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අප ප්‍රාදේශීය සභාවේ නරාවල, පෝද්දල, හා උළුවිටිකේ යන කොට්ඨාශ 03 හි සියලුම පරිපාලන කටයුතු මීපාවල පිහිටි උප කාර්යාලයට පැවරීම හා අනෙකුත් කොට්ඨාශ 09 හි සියලුම පරිපාලන කටයුතු කලේගාන පිහිටි ප්‍රධාන කාර්යාලයට පවරන ලෙස මම යෝජනාවට සංශෝධනයක් ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 13. කරාපිටිය, ගොඩකන්ද මාර්ගයේ වනිගසේකර මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය තාර දැමීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 14. කරාපිටිය කොට්ඨාශයේ දිරාපත් වූ ටියුබ් ලයිට් ඉවත් කිරීම සඳහා නැමි පයිප්ප කට්ටල 60 ක් ගෙන ඒමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පහුගිය කාලේ යෝජනාවක් ආවා සෝඩියම් වේපර් ලයිට් වෙනුවට L.E.D බල්බ් දාන්න කියලා. ඒක ක්‍රියාත්මක වුනේ නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වීථි පහන් කට්ටල ගෙනාවේ දිරපුවට දාන්න කියලා. අපිට ගේන එක වෙන්වුන මුදල අතරේ කරන්න ඕන. දිරාපත් වුන ලයිට් ටිකට ලයිට් එක ගානේ දෙන්නම්.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 15. කරාපිටිය ප්‍රදේශයේ ආවරණය වන පරිදි ආයුර්වේද මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා ඒක යෝජනාවක් විදියට ගේන්න පුළුවන්. කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ප්‍රශ්න තියෙනවා. වෛද්‍යවරයෙක් ඕන. ඖෂධ සංයෝජක කෙනෙක් ඕන. ඒ ටික කාඩර් එකට එන්න ඕන. අලුත් එකක් හදන්න. බිල්ඩින් හදන්න පුළුවන් අපි කොහොමද සේවකයන් සපුරාගන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපිට දිනයක් දෙකක්වත් වෙන් කරන්න බැරිද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි මීපාවල තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සම්පත්දායකයෝ ඒ පැති වලට යොදව ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කියන්නේ ජංගම සේවයක් වගේද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔව්. ජංගම සේවයක් වගේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ස්ථානයක් ගන්න පුළුවන්ද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-**ඔව්. හොයලා දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මෙහෙම කරමු එහෙම නම් කපුහෙම්පල, ලබුදූව, කරාපිටිය කොට්ඨාශ 03 ට ඔබතුමා තැනක් හොයලා කියන්න මධ්‍යස්ථ තැනක්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ලැන්දැව හන්දියේ තිබුණා ආයුර්වේද මධ්‍යස්ථානයක්. ඒක දැන් නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අයට හපුගල දුර නැනේ. ඒ අය දැනුවත් කරමු. එතනටත් එකක් දාන්න බැරිවෙයි සුගත් මන්ත්‍රීතුමා. ඔබතුමාට ප්‍රජාශාලාවක් හරි ඉඩමක් හරි බලලා කියන්නකෝ මන්ත්‍රීතුමා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කපුහෙම්පල, කරාපිටිය, ලබුදූව කොට්ඨාස 03 ආවරණය වන පරිදි සතියකට දවස් 02ක් ජංගම සේවාවක් ලෙස ආයුර්වේද සායනයක් පැවැත්විය යුතුය කියලා එම යෝජනාවට මම සංශෝධනයක් ඉදිරිපත් කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 16. හිරිඹුර සුමුදු පෙර පාසලේ ආරක්ෂිත වැට හා සෙල්ලම් උපකරණ කඩිනමින් සකසා දීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 17. කරාපිටිය පන්විලදූව වත්තේ දීර්ඝකාලීන ගැටලුවක්ව පවතින ජලය බැස යාමේ ගැටලුව විසඳීම සඳහා කොන්ක්‍රීට් කාණුවක් ඉදිකිරීමටත් , ගැටලු මතුවේ නම් සභාපතිවරයා සතු බලතල ක්‍රියාත්මක කිරිමටත් යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 18. කරාපිටිය දෙණියවත්ත මාර්ගයේ නිවාස 15කට ගමන් ගන්නා මාර්ගයේ බාධාවන අයුරින් ඇති විදුලි කණුව හා දුරකථන කණුව බාධාවන් මග හැරෙන සේ නැවත සිටුවීමට අදාළ ආයතනයන් දැනුවත් කිරීමට යෝජනා කරමි.

මේ කරාපිටිය, දෙණියවත්ත, කිරිමැටිමුල්ල පාර. අඩි 05ක මාර්ගයක් මේක. දුරකථන කණුවයි, විදුලි කණුවයි සමාන්තරව සිටුවලා තියෙනවා. වාහනයක්වත් හරවන්න බෑ. ඒ ආයතන 2ට ලිපියක් යවලා දැනුම් දෙන්න තමයි මම යෝජනා කරේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා, ඒ කණු ඉන්දනකොට සභාවේ අනුමැතිය ගන්න කියන්න බැරිද ?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරන්නේ නැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ පාරේ එක පැත්තක දුරකථන කණුව. අනෙක් පැත්තේ විදුලි කණුව.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 19. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂකයා ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරිපත් කල යුතු බවට යෝජනා කරමි. ( ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රධාන කාර්යාලයට ලිපියක් යැවීමට යෝජනා කරමි.)

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ආසන බල මණ්ඩලයට හරි පක්ෂ සමුළුවකට හරි ගිහින් ඉදිරිපත් කරන්න ඕන යෝජනාවක්. මේක පක්ෂයට ගිහිං කියන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ යෝජනාව සභාවේ විෂය පථයට අදාල වෙන්නේ නෑ. අපි බෙදීමක් ඉල්ලනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාඃ-** එම යෝජනාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන් පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 18
විපක්ෂව - 02
සභා ගර්භයේ නොසිටි - 02

**යෝජනාව සභා සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රිනී ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
12. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
13. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
14. ගරු මන්ත්‍රිනී පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
15. ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
16. ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
17. ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා
18. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

**යේජනාව සභා සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
02. ගරු මන්ත්‍රී අනිල් බන්දුතිලක මැතිතුමා

**සභා ගර්භයේ නොසිටි පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාඃ-** එම යෝජනාව වැඩි ඡන්ද 16කින් සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාඃ-** 20. උක්වත්ත නැගෙනහිර ඉහළ තොටුපල සහ එම මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාඃ-** 21. බිම්බිරිගොඩ මාර්ගයේ කාණු පද්ධතිය සමඟ මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාඃ-** 22. සේරියගොඩ දූවවත්ත මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාඃ-** 23. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට අයත් දැනට භාවිතයට නොගන්නා වී.සී පාරට මුහුණපා ඇති බිම් කොටසේ පොදු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා කරමි.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාඃ-** අපේ කලේගාන උතුර, කලේගාන දකුණ මිනිස්සුන්ට රැස්වීමක් තියන්න තැනක් තියා සෙල්ලම් කරන්නවත් තැනක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීවරුන්ගේ අදහස් මොනවාද මේ යෝජනාව සම්බන්ධව ?

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ යෝජනාව ගැන මගේ අදහස නම්, සභා ගොඩනැගිල්ල නව ගොඩනැගිල්ලක් විදියට ප්‍රතිසංස්කරණය කරලා ක්‍රියාත්මක වෙනකොට ඒ පර්චස් 07ක සභාවට ආසන්න ඉඩම අවශ්‍ය වෙයි. වෙනත් කටයුත්තකට ඒ ඉඩම දුන්නොත් අපිට පවරාගන්න ගියාම ගැටලුවක් වෙයි. අපේ සැලැස්මක් තියෙනවනේ. සභා ගොඩනැගිල්ල ඒ විදියට හැදිලා එනකොට ඒ පර්චස් 07ක ඉඩමේ වටිනාකම අපිට කියන්න බෑ. ඒ හේතුව නිසා මේ යෝජනාවට මම විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඒකට අරමුදල් කොහෙන්ද ?

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාඃ-** මම හොයාගන්නම් අරමුදල්.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** තිස්ස මන්ත්‍රීතුමා ජනතාවත් එක්ක ඉන්න නිසා ජනතාවගේ ඉල්ලීමට මේ යෝජනාව ගේන්න ඇති. ඒ යෝජනාව ගෙනාපු එක හරි. ඒ අයට කරුණු පැහැදිලි කරලා දෙන්න. මේක වාණිජ වටිනාකමක් තියෙන ඉඩම් කෑල්ලක්. එතකොට මේ සභා ගොඩනැගිල්ල ලොකුවට හදන දවසකට වාහන දාන්න තැනක් ඕන. එතනදි අපිට පුළුවන් වාහන පාකිං එකක් විදියට මේක පාවිච්චි කරන්න. වාහන ටික වෙන කොහේවත් දාන්න බැනේ. සභාව ළගම තියෙන්න ඕන. ඒ නිසා ඔබතුමාගේ කොට්ඨාසය තුල වෙනත් ඉඩමක් තියේ නම් ඒක යෝජනා කරන්න. මේ යෝජනාව ගැන ජනතාවට පැහැදිලි කරලා දෙන්න මේ ප්‍රශ්නය ගැන. අපිත් කැමතියි ජනතාවට මේක දෙන්න පුළුවන්නම්. ඒත් ප්‍රශ්නය ඒකයි. සභාව ලොකුවට හැදෙනවා ඉස්සරහට.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාඃ-** 24. වසරක් පාසා කලේගාන දකුණ, කලේගාන උතුර අඩු ආදායම්ලාභී පවුල්වල ළමුන් උදෙසා පිරිනමන අභ්‍යාස පොත් සඳහා සභාව මගින් පිරිනමන රු.25,000.00ක මුදල ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සමිතියකට ඉල්ලන්නේ. කලින් පොල කරේ ඒ සර්වෝදය දේදුණු සමිතිය. ඊට පස්සේ ඒ පොල සභාවෙන් පවරාගත්තා. ඒකට හරියන්න ඒ ගොල්ලන්ට රු.25,000.00ක මුදලක් දුන්නා. ඒක නවක මන්ත්‍රීවරු දන්නේ නෑ. ඒකයි දැනුවත් කරේ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාඃ-** කලේගාන කොට්ඨාසය ආවරණය වන පරිදි අඩු අදායම්ලාභී පවුල්වල ළමුන්ගේ නම් ලැයිස්තුවක් සකස්කරලා සභාවේ අධීක්ෂණය යටතේ මෙම කාර්යය සිදු කරන්න ඕන කියලා මම ඒ යෝජනාවට සංශෝධනයක් ඉදිරිපත් කරනවා.

තිස්ස මන්ත්‍රීතුමාගේ යෝජනාව මම සංශෝධනයට යටත්ව ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි නැවත අධීක්ෂණයක් කරන්න ඕන. නිකම්ම රු.25,000.00 දීලා වැඩක් නෑ. දීපු ළමයින්ගේ නම් ලැයිස්තුව අපිට ඕන. මොකක් හරි ක්‍රමවේදයක් හැදෙන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මහ ඇමතිතුමාගේ අනුමැතිය ආවට පස්සේ හැබැයි දෙන්න වෙන්නේ. ගියපාර අනුමැතියට යවපු එකට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් දන්වලා තිබුනා විස්තර අඩුයි කියලා. අපි ඒ වැඩේ කරමු ඒ කරුණු කාරණා යටතේ. සභාවේ අධීක්ෂණය යටතේ කරමු. අපේ මුදල් කමිටුවට මිල ගණන් කැඳවලා ඒ වැඩේ කරන්න පුළුවන්. ඒ ටික ගත්තම මහ ඇමතිතුමාගේ අනුමැතිය දේවී. ඒ තොරතුරු අදාළ සමිතියටත් දන්වා යවන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාඃ-** 25. වටරැක - නැගෙනහිර පහලගෙදරවත්ත පාරේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** 26. අපේගම - රත්නායක වලව්වත්තේ සිට ගලා බසින කාණුව අවසන් කොටසේ සිරිල් මහතාගේ කඩය අසල කොටස පැති කාණුව ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** 27. පලාගලකන්ද ප්‍රධාන මාර්ගයේ ලේකම්වත්ත මහතාගේ නිවස අසල පැති බැම්ම ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, වෙනත් කරුණක් ඉදිරිපත් කරන්න තියෙනවා අනතුරුදායක ගස් පිළිබඳව. ඒක ගැන ප්‍රගතියේදී කරුණු දක්වන්නද ?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන ප්‍රගතියේදී කරුණු දක්වන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම මේ යෝජනාවක් නෙමෙයි මේ කරන්නේ. අපේ කම්කරුවෝ දාලා පළාත් සභා පාරක් සුද්ධ කරන්න බෑනේ. නමුත් අපේ මහ හපුගල පන්සල ඉදිරිපිට තියෙන පළාත් සභා පාරේ පල්ලිය ඉස්සරහ විතරක් ටිකක් කම්කරුවෝ දාලා සුද්ධ කරවලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කාර්මික නිලධාරී අධීක්ෂණය යටතේ කරන්න දැනුම් දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම කණගාටුවෙන් මේ ප්‍රකාශ කරන්නේ මම මීට කලින් සභාවේ ප්‍රකාශ කරා මාර්ගයක් සම්බන්ධව. ඇත්තටම මන්ත්‍රීවරු බොහොම වගකීමෙන් කටයුතු කළ යුතුයි. මේ මොහොතේ මට දුරකථන ඇමතුමක් ලැබෙනවා. මේ සභාවේ මම කතා කරපු දේ පටිගත කරලා ලැබෙන්න සැලැස්සුවා කියලා. මගේ ප්‍රකාශ නිවැරදි නිසා මම බය නෑ ඒකට. මම මේක ගැන හොයලා තමයි කතා කරේ. මේක නවත්තන්න කරන්න ඕන මොනවද කියලා උපදෙස් අරගෙනයි මම මෙතනට ආවේ. නමුත් සහෝදර සහෝදරියන් අතරත් යම් සට්ටනයක් මේකෙන් පුද්ගලික වාසි ගන්න බලන්නේ. ඒක පාර්ශවයකට, එක පුද්ගලයෙකුට උදව් කරන්න හදන්නේ. මා කියපු ප්‍රකාශ වැරදි ලෙසට අර්ථ ගන්වලා කතා කරලා තියෙනවා. ඒ නිසා බොහොම කණගාටුයි. වගකීමෙන් මම කතා කරන්නේ. එක් පක්ෂයකට විතරක් නම් එතුමා කටයුතු කරන්නේ ඔබතුමා සභාපති විදියට තීන්දු තීරණ ගන්න අවශ්‍යතාවය පරිදි. හරිදේ තීන්දු තීරණ කරන්න. එතන කන්ද උඩට කාණුවක් දාන්න හදන්නේ. සභාවෙන් විදුලි පහන් සවි කරන්න ගියාම එතන ඉදිරියේ තියෙන කණුවට දාන්න එපා කියලා එලවලා තියෙනවා. මම ඉදිරියේදී ඒ කණුවට ලයිට් එකක් දානවා. පාරේ යන ළමයි අල්ලන් යනවට තාප්පේ ග්‍රීස් ගාලා තියෙන්නේ. ඒ හේතුන් නිසා ගම්මුන්ගෙන් විරෝධතාවයක් ආපු නිසා තමයි මේ කතා කරන්නේ. එහෙම නැතුව මම කාගේවත් දේවල් වලට පුද්ගලිකව ඇඟිලි ගහන්නේ නෑ. මාදුගොඩ මහත්තයාගෙන් අහලා තමයි මේ යෝජනාව මම ගෙනාවේ. ඒ යෝජනාව ස්ථිරකරපු පද්මසේන මහත්තයාගෙනුත් අහලා තමයි මම මේ යෝජනාව ගෙනාවේ. ඒ නිසා ඒකපාර්ශවිකව තීන්දු තීරණ ගන්න එපා. ගරු සභාපතිතුමාට, ගරු මන්ත්‍රීවරුන්ට මම කියනවා ගිහින් බලන්න කියලා ප්‍රශ්නය කුමක්ද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා නවක මන්ත්‍රීවරයෙක් විදියට ඕවට මූණ දෙන්න ඕන. ඕක තමයි ප්‍රාදේශීය සභාවක තත්වය. මට එන ප්‍රශ්න ප්‍රමාණය මම දන්නවා. මන්ත්‍රීවරුන්ටත් ඔය අත්දැකීමට මුහුණ දෙන්න වෙනවා. මෙතන රෙකෝඩ් කරලා යන එක වළක්වන්න බෑ. ඒ සිද්ධිය සම්පූර්ණයෙන්ම මම හෙළා දකිනවා. මොන ප්‍රශ්නය තිබුනත් මෙතනින් යනකොට ඒ ප්‍රශ්න ටික බේරගෙන යන්න ඕන. මම මෙතන වෙන කිසි ප්‍රශ්නයක් ගෙදර ගෙනියන්නේ නෑ. තැන් තැන්වල කතා කරන්නේ නෑ. සභාපතිවරයා විදියට මට කොයිතරම් ප්‍රශ්න එනවද. ඔබතුමා සද්භාවයෙන් කටයුතු කරන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමාට කරන්න කියලා උපදෙස් දීලා ඒකට විරුද්ධව පෙත්සම් ගහපුවත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හිටපු සභාපතිවරුන්ට කියලා වැඩේ කරගෙන, ඒකට පෙත්සම් ගහලා අල්ලලා දීලා ගෙදර යවපු අවස්ථාවල් තියෙනවා. ඒ වගේ පූර්වාදර්ශ තියෙනවා මේ සභාවේ. ගණන් ගන්න එපා. ඔය වගේ අත්දැකීම් ලැබෙන්න ඕන.

**ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා ඃ-** මම සභාපතිතුමා, ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා. අර අපි කලින් යෝජනා කරපු ප්‍රීමික්ස් ව්‍යාපෘතිය ආරම්භකරලා දැන් ප්‍රීමික්ස් සකස් කරලා මේ වෙනකොට පාරවල් කීපයකට දාලා තියෙනවා. මුලින්ම චමින්ද මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයෙන් පටන් ගත්තා. ඊට පස්සේ සභාපතිතුමාගේ කොට්ඨාසයේ පාරවල් සකස් කරා. ඒක ප්‍රාදේශීය සභා මට්ටමෙන් ගත්තම විශාල මුදල් ඉතිරියක්. අපේ කොට්ඨාසයේ ඒවා කතා කරොත් අනිත් ඒවා නැතුව, අර පැච් ටිකට ගල් දාලා වහලා, තාර දාලා, චිප්ගල් එහෙම දාලා කරා නම් ලක්ෂ 7ක් 8ක් යනවා. දැන් ප්‍රීමික්ස් දාන නිසා සෑහෙන මුදලක් ඉතිරි වෙනවා. මම මීට කලිනුත් ප්‍රකාශ කරලා තියෙනවා. හැම පාරකම තියෙන්නේ මේ වගේ ප්‍රශ්න. සේරියගොඩ පාරෙත් ඔය වගේ ප්‍රශ්න තියෙන්නේ. ලොකු වලවල් කීපයකුත් තියෙනවා. අපි කව්රුත් එකතුවෙලා, කාගෙත් සහයෝගය අරගෙන ඒ ප්‍රීමික්ස් මිශ්‍රණය දාමු. දැන් බොහෝ පාරවල් ප්‍රමාණයක් හදලා ඉවරයි. කරන්න තියෙන්නේ කැඩිච්ච, බිඳිච්ච තැන් ප්‍රතිසංස්කරණය කරන්න. ඒක නිසා මන්ත්‍රීවරු විදියට ලොකු මුදල් වැය කරන්න යෝජනා කරනවට වැඩිය සභාවේ මුදල් ඉතිරි කරමින් කාණු පද්ධති සකස්කළ යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කියපු කතාව 100%ක් ඇත්ත. අපි කණ්ඩායම් රැස්වීමෙත් ඒක ගැන කතා කරා. පාරවල් 6ක් 7ක් විතර අපි ප්‍රීමික්ස් දාලා ඉවර කරලා තියෙනවා. මොල්ලිගොඩවත්ත පාර බලන්න. මම වඩාත්ම සතුටු වෙන්නේ සභාපති විදියට ප්‍රීමික්ස් ව්‍යාපෘතිය පටන් ගැනීම පිළිබඳව. ගම්පෙරළිය වැඩසටහනත් ඉවර වෙනකොට බෝපෙ පෝද්දල සංවර්ධනය නොවුන පාරවල් ඉතිරි වෙන්නේ නෑ.

කාසල් හිල් වල තමයි තියෙන්නේ. එහේ සෑහෙන්න පාරවල් ප්‍රමාණයක් අලුතෙන් හදන්න තියෙනවා. මන්ත්‍රීවරු විදියට බලපෑම් මුකුත් කරන්න එපා. 50%කට වඩා අඩුවෙන් කැඩුණු පාරවල් තමයි ප්‍රීමික්ස් කරන්නේ. ඉතින් ඊට වඩා කැඩුණු පාරවලුත් මේකෙන් කරන්න කියලා බලපෑම් කරන්න එපා. එතකොට අසාර්ථකයි. පාරවල් යෝජනා කරන්න. අපි කතා කරලා බලලා කරමු. වතුරට කඩපු තැන් ටික පිළිසකර කරන එක තමයි අපේ පළවෙනි අරමුණ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, එතනදි පොඩි කරුණක් කියන්න ඕන. කාර්මික නිලධාරී මහත්වරු කොට්ඨාස වලට වෙනස් වෙනස් තීන්දු ගන්න ප්‍රශ්නයක් තියෙනවා. මම පසුගිය දවසක යෝජනාවක් කරා කපුහෙම්පල නුගබෝධිය ගාව පටු මාර්ගයකට සිලින්ඩර් දාලා සකස් කරන්න. ඊට පස්සේ ප්‍රීමික්ස් කරේ නෑ. මෑතකදි වෙනත් ප්‍රදේශයක ඒ විදියට කාපට් එක තියෙන පාරක් කපලා සිලින්ඩර් බැස්සුවා. ඒක ප්‍රීමික්ස් කරා. කිසිම ගැටලුවක් නෑ. හැබැයි කපුහෙම්පල නුගබෝධිය ගාව තියෙන පාර ප්‍රීමික්ස් කරන්න කිව්වම ඒකට පොඩි ඇස්තමේන්තුවක් හදලා ඒක දාන්න ඕන කියලා කිව්වා. අඩි එක හමාරක විතර පැච් එකක් තිබුනේ. ස්ථානයෙන් ස්ථානයට තීන්දු වෙනස් වෙනකොට හරි ගැටලුවක් තියෙන්නේ. ඒ වගේම වෙනත් කොට්ඨාසයක ඒ විදියටම සිලින්ඩර් බස්සලා තියෙනවා. ඒ සියල්ල ඒ විදියටම උනා. මම ඒ පාර ලේකම්තුමාට කතාකරලා ඒක ප්‍රීමික්ස් කරා. ප්‍රශ්නයක් තියෙනවා සමහර කොට්ඨාස අනුව කාර්මික නිලධාරීන් තීන්දු තීරණ ගන්නේ වෙනස් වෙනස් විදියට.

ඊලගට පසුගිය නිදහස් දින උත්සවයේදී මම ලොකු කටයුත්තකට මුල පිරුවා. ඒකට මට සභාවෙන් ලැබුණු සහයෝගයට බොහොම ස්තුතියි. 71වන නිදහස් උළෙල වෙනුවෙන් කපුහෙම්පල කොට්ඨාසයේ කඩා වැටුනු නිවසක් තිබුනා ලෑලි වලින් හදපු. ඒ නිවස ප්‍රදේශයේ ව්‍යාපාරිකයන්ගේ, පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය මත ඒ නිවස දින 100ක් ඇතුලත වැඩ අවසන් කරා. ඒ කටයුත්ත සඳහා මුල්ගල් තැබීමට ගරු සභාපතිතුමා ආවා. පළාත් සභාවේ මන්ත්‍රීවරු කීප දෙනෙකුත් ආවා. දින 100ක් ඇතුලත ඒ වැඩකටයුතු සියල්ල සාර්ථකව අවසන් කරා. ගරු සභාපතිතුමා දුන්න සහයෝගය අගය කරනවා. විශේෂයෙන්ම ඒ නිවසට යන මාර්ගය අවට සුද්ධ කරලා ප්‍රීමික්ස් ව්‍යාපෘතිය ඒ කොට්ඨාසයට ගෙන්නලා දුන්න සහයෝගයට උපසභාපතිතුමා හැටියට, ඒ ප්‍රදේශයේ මහජන නියෝජිතයා හැටියට මගේ ගෞරවණීය ස්තුතිය ඔබතුමාට පළ කරනවා. අතිවිශාල වැඩකොටසක් ඒ සමගාමීව ඒ ප්‍රදේශයේ සිද්ධ උනා. ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ටත් මම ස්තුතිය පළ කරනවා. ඒ වගේම හිටපු මන්ත්‍රී කුලරත්න මැතිතුමාත්, අබේසේකර මන්ත්‍රීතුමත් පක්ෂපාට භේදයකින් තොරව සහයෝගය ලබා දුන්නා. ඔවුන් දෙපලටත් මම ස්තුතිවන්ත වෙනවා.

<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>

<u>**01. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තා**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 01. 2019-01-22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

02. 2019-02-08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**02. කර්මාන්ත හා සේවා කමිටු වාර්තා**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 01. 2019-02-08 දින පැවති කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තා**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 01. 2019-02-08 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**04. පරිසර කමිටු වාර්තා**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 01. 2019-02-08 දින පැවති පරිසර කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

කමිටු 4ම තිබුනා මේ මාසේ. ඒ කමිටුවලට සහභාගීවුන සියලු දෙනාටම ස්තූතිවන්ත වෙනවා. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවයි, පරිසර කමිටුවයි අඩුම ගානේ මාස 2කට පාරක්වත් කැඳවන්න බලාපොරොත්තු වෙනවා. අනිත් කමිටු 2ක මාසිකව හෝ සති 2කට වරක් කැඳවන්න බලාපොරොත්තු වෙනවා.

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛණ ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.**

<u>**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ.**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ජනවාරි මස මාසික ලැබීම් විශ්ලේෂණය (ප්‍රා.ස. 01)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස. 14)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2018 වර්ෂයේ දෙසැම්බර් මස හා 2019 වර්ෂයේ ජනවාරි මස සංශන්දනාත්මක මාසික ලැබීම් විශ්ලේෂණය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛණ.**

**I. ප්‍රගතිය.**

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුනි, පසුගිය මහා සභාවකට මම මන්ත්‍රීවරයෙක් හැටියට යෝජනාවක් ඉදිරිපත් කරා කිතුලම්පිටිය ආනන්ද මාවතේ අංක 43, ඒ.වී.චන්ද්‍රවතී මහත්මියගේ ඉඩමේ සිට ආනන්ද මාවත ප්‍රධාන බස් මාර්ගයට නැමී ඇති තැඹිලි ගසක් සහ පොල් ගසක් අනතුරුදායක බැවින් ඒ ගස සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න ලෙස ඉල්ලලා. ඒකට අපේ නිලධාරී මහත්මිය පරීක්ෂා කරලා ඒම ගස් දෙක ඇදලා වෙනත් ගස් 2ක බඳින්න කියලා තීරණය කරලා ඒ අදාල පාර්ශවයට ලිපියකින් දැනුම් දීලා තිබුනා. නමුත් ඒක මේ වෙනකම් ක්‍රියාත්මක වුනේ නෑ. ඉන් එහාට ඉදිරි පියවරක් සඳහා සභාව ක්‍රියාත්මක උනේ නෑ කියලා කණගාටුවෙන් කියන්න ඕන. බස් මාර්ගයක් ඒක. බස් එකට නගින්න මිනිස්සු ඉන් එක ගහක් යට නැවතිලත් ඉන්නවා. ගස් දෙක ඇදලා බැන්දෙත් නෑ. ඉන් එහාට ක්‍රියාමාර්ගයක් ගත්තෙත් නෑ. ඒ ගැන මගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. ආනන්ද මාවතේ සුප්‍රීම් සිටි එක ඉස්සරහ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රධාන පාරේද ? ප්‍රධාන පාරේ ශාන්ත අයියලගේ බේකරිය ගාවද?

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඔව් ඒක. මේ ගැන ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

පැලවත්ත ග්‍රාම නිලධාරී වසමේ පොල්ගසක් අනතුරුදායකයි කියලා කපන්න තීරණය වෙලා, පොලිස් ස්ථානයටත් සභාව මඟින් ලිපියක් යවලා දෙසැම්බර් 29 දින පොලිස් නිලධාරීන් පැමිණ සහයෝගය දෙන්නත් එකඟව තිබියදී, උදෑසන 10ට ගස කපන්න සභාවේ සේවකයන් සූදානම්ව සිටියදී, ගස කපන්න යන වියදම දරන්නත් ගස් හිමියන් කැමැත්ත පළ කරලා සියලුම දේ සිදුවෙලා තියෙනකොට එදා උදේ 9.35ට පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ලේකම්තුමාට ලබා දීපු හදිසි දුරකථන පණිවිඩය නිසා මේ ගස කපන්න එපා කියලා දැනුම් දුන්නා. ඒ ගස තාමත් ඒ විදියටම තියෙනවා. මේක කොහොම වුනාද දන්නේ නෑ. අපිට ගැටලුවක් තියෙනවා, අනතුරුදායකයි කියලා තීරණය කරපු, විමර්ශන නිලධාරීතුමා ඇවිත් මේ ගස බලලා මේ ගස අනතුරුදායකයි කියලා වාර්තාවක් සපයපු, ගෙයක් ආසන්න තියෙන ගසක් කපන්න එපා කියලා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය නියෝග නිකුත් කිරීම පිළිබඳව. ඒ ගැන අපි කණගාටුවෙනවා. දැන් ඒකට මාලු දැලක් දාලා තියෙනවා. මට ඒ සම්බන්ධව දෙපැත්තෙන්ම ප්‍රශ්න ඇවිත් තියෙනවා. ගස් හිමියනුත්, ගසෙන් හානිවෙන අයත් දෙගොල්ලොම අපේ හිතවත්තු. ඒකයි තත්වය.

ඊගාවට, පැලවත්ත ග්‍රාම නිලධාරී වසමේ රත්නායක වලව්ත්තේ පොල් ගසක් පාරට නැවිලා තියෙනවා 45˚ක් විතර. ගෙඩි සම්පූර්ණයෙන්ම වැටෙන්නේ පාර මැදට. එතන ඉදිරිපිට ගරාජ් එකක් තියෙනවා. වාහනයක් නවත්තන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා. ඊට එහා ගෙදර මිනිස්සු ගෙදරට යන්න ඕන මේ ගහ පහුකරගෙන. එහෙම තත්වයක් තියෙද්දී මේ ගස ඇද බඳින්න කියලා තියෙනවා. ඇදලා බැන්දේ නැති නිසා දැලක් යොදන්න කියලා තියෙනවා. දැලක් යොදන්නේ නැති හින්දා පැමිණිලි පාර්ශවය මේ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුවට පැමිණිලි කරලා තියෙනවා. ඒ

නිසා පළාත් පාලන දෙපාර්තමේන්තුව අපේ සභාපතිතුමාට ලිපියක් යොමු කරලා තියෙනවා 2019-01-22 දින. ඒ සම්බන්ධව ක්‍රියා කරලා සති 2ක් ඇතුළත දන්වන්න කියලා. අද 2019-02-18 දින. මේකට සති 2ක් පිරෙන්නේ 2019-02-07 දිනට. නමුත් ඒ තත්වය එහෙම පවතිනවා. ඒ ගෙදර පොඩි ළමයා යනකොට අඩි 2ක් විතර තියෙද්දී මහා විශාල පොල් ගෙඩියක් වැටුනා. අනූනවයෙන් ඒ ළමයා බේරුණේ. ගහේ ගෙඩි විශාලයි. තමුන්නාන්සේලට මේ අනතුරුදායක ගස්වල ප්‍රශ්න තියෙනවා. අපිත් ගහක් ආරක්ෂා කරගන්න සතුටුයි. නමුත් ගහක් කැපුවොත් සිටුවන්න පුළුවන්. මිනිහෙක් මැරුණොත් මනුස්සයෙක් ආපහු උපද්දවන්න බෑ. ඒක තේරුම් ගන්න ඕන. මේ පනතෙන් බලය පවරලා තියෙන්නේ පැය 24ක් ඇතුලත අනතුරුදායක ගහක් සම්බන්ධව ක්‍රියාකරන්න කියලා. ඒක තමයි පනතෙන් දීලා තියෙන බලය. උපරිම සීමාව. එහෙම නැතුව යන්න ගියාම අමාරුවේ වැටෙනවා. ලේකම් මහත්තයා එක්කයි, අනුෂ්කා මිස් එක්කයි ලේඩිස්ලා දෙන්නෙක් ඇවිත් රණ්ඩු වුනා. කොට්ඨාසයේ මන්ත්‍රීවරයා විදියට මටත් ඒකට සම්බන්ධ වෙන්න වුනා. අපිත් එක්ක නිලධාරීන්ට තියෙන සහජීවනය නැතිවෙලා යනවා මේ වගේ ප්‍රශ්න නිසා. ඒ නිසා අපි කියන්නේ කරුණාකරලා මතක තියා ගන්න රාජ්‍ය සේවයේ ප්‍රචලිත කියමනක් තියෙනවා. තමුන්නාන්සේලා අතරත් රාජ්‍ය සේවයේ ඉඳපු අය ඇති. සභාපතිතුමත් රාජ්‍ය සේවයෙනේ හිටියේ. "ඉහළ නිලධාරීයාගේ පෑනේ තුඩ මුවහත් වැඩියි. පහළ නිලධාරීයාට එකෙන් ලිව්වම කොයි වෙලේ හරි බෙල්ල කැපිලා යන්න පුළුවන්." මේ 22 වෙනිදා එවපු ලියුමට අඩුම තරමේ ලිපියක්වත් යොමු කරලා නෑ දින 14ක් ඇතුලත. ඉතින් එහෙම වුනාම මට ලැජ්ජයි. ඒ ලේඩී ඇහුවේ සභාවෙන් වැඩක් තියේද කියලා, මේ වැරැද්ද අපි හදා ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට තියෙන බලතල ලේකම්තුමාට පවරලා තියෙන්නේ. අනතුරුදායක ගස් සම්බන්ධ කටයුතු ලේකම්තුමා තමයි කරන්නේ. මෙතුමා කියපු කාරණාවේ පරස්පරතාවයන් තියෙනවා. පළාත් පාලන කොමසාරිස් කාර්යාලය අපේ ඉහළ නිලධාරීන් නෙමෙයි. ඒ ගොල්ලෝ ඉන්නේ අපිට මගපෙන්වීම් කටයුතුවලට විතරයි. ඒගොල්ලන්ට බෑ අපිට නියෝගයක් කරන්න. පළාත් පාලන කොමසාරිස්ට, සභාපතිට නියෝගයක් කරන්න බෑ. උපදෙසක්, මඟ පෙන්වීමක් කරන්න පුළුවන්. ඔබතුමා කියපු කාරණාවෙ දෙපැත්ත පරස්පරයි. එකක් සහකාර කොමසාරිස්තුමිය ලේකම්තුමාට කෝල් එකක් දීලා ගහ කපන එක නැවැත්තුවා කියන එක ගහ මොකක්ද, අනතුර මොකක්ද කියලා දකින්නේවත් නැතුව. ඒ ගොල්ලන් ඒ දේ කරන්නේ ස්ථානීය පරීක්ෂාවක් නොකර. එයාලව හම්බවෙලා කව්ද ඉදිරිපත් කරන්නේ එයා ඒකට උත්තරයක් දෙනවා. 10ට ගහ කපනවා කියල ඇවිත් කකුල් දෙක අල්ලලා පින්සෙන්ඩු වුනාම 9.35ට කෝල් කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** පළාත් පාලන කොමසාරිස්ට අපිට නියෝගයක් නිකුත් කරන්න බැරිවුනාට, ඒ දීපු නියෝගය පිළිගත්තනේ. ගහ කපන එක නැවැත්තුවා. අපි නියෝගයට අවනත වෙලානේ එතකොට.

ඊගාවට සභාපතිතුමා මේ සභාව වැඩක් නෑ, ගහක්වත් කපා ගන්න බෑ කියලා අහගන්න නිලධාරීන් වගේම මන්ත්‍රීවරුනුත් කැමති නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මීට පස්සේ අනතුරුදායක ගස් පිළිබඳව සාකච්ඡා කරන්න සති 2න් 2ට සාකච්ඡා දාගමු.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මට කියන්න තියෙන්නේ මේකයි. 01-22 එවපු ලිපිය අපිට එවලා තියෙන්නේ පියවරක් අරගෙන සති 2ක් ඇතුලත වාර්තා කරන්න කියලා. අපි පස්සේ හෙයාගෙන යනකොට දැනගත්තා අනුෂ්කා මිස් දුරකථනයෙන් විමර්ශන නිලධාරීතුමාව දැනුවත්කරලා තියෙනවා කියලා මෙහෙම ගහක් තියෙනවා විමර්ශනයක් කරන්න අවශ්‍යයි කියලා. එතකොට ඒක දන්නේ ඒ මිනිස්සු ඊයේ මෙතනට ආවමනේ. ලියුමකින් දන්වලා තිබුණානම් ඒ ගහෙන් අනතුරක් වුනානම් බේරෙන්න තිබුණා. අනතුරුදායක ගස් පිළිබඳව ප්‍රවේශම්ව කටයුතු කරන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-**මේ සභාවේ අනතුරුදායක ගස් කපන එක හරිම දුර්වලයි. 2018 වර්ෂයේදී ගස් කපන්න තීරණය කරනවා. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීතුමත් බලලා ගහ කපන්න තියෙනවා. 2018 වර්ෂයේ ඉඳන් ලිපි බර ගණනක් ගහ කපන්න කියලා යවලා තියෙනවා. පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ස්ථානීය පරීක්ෂනයක් කරලා මේ ගහ වහාම කපන්න කියලා තියෙනවා. ගහ අයිතිකරු ගහ කපන්නෙ නැත්නම් සභාවෙන් කපන්න ඕන. ගහක් අනතුරුයි කියලා අනතුරු වුනාට පස්සේ තීන්දුව දීලා වැඩක් නෑ. තරහට ගස් කපන්න එන ඒවත් තියෙනවා. ස්ථානීය පරීක්ෂනයක් කරනවානේ ඒක නම් වහලටම තියෙන්නේ.

අනතුරක් වෙලා නඩු දැම්මොත් සභාවට වන්දි ගෙවන්න සිද්ධ වෙයි. මේක සම්බන්ධ තීන්දු තීරණ පරක්කු කරන්න එපා. කරන්න පුළුවන් උපරිමය කරලා දෙන්න.

අරලියගහවත්ත පාරේ ගහ කපන එක මාස ගණනක් තිස්සේ කථා කරලා තියෙන්නේ. ඒ පාරට ලක්ෂ 20ක සල්ලිත් ඇවිත් තියෙනවා. ඉවර වෙච්ච නඩුවක් තියෙන්නේ. උසාවියෙන් ඉල්ලන්න මෝසම් එකක් දාලා. උසාවියෙන්ම මිනින්දෝරුවෝ දාලා වෙන් කරලා වැට ගහලා දීපු පාරක් ඒක. කැබලි වලට ගෙවන්න ඕන ගාස්තුව ගෙව්වෙ නෑ කියලා මේ ප්‍රශ්නය වෙලා තියෙන්නේ. අපිට තියෙන්නේ ඒ නඩු අංකය අරගෙන උසාවියට මෝසම් එකක් දාලා කියන්න. මේ පාරේ ගහක් තියෙනවා. ඒ නිසා අපිට පාර හදාගන්න විධියක් නෑ. ගහ අනතුරුදායකයි. ඒ හින්දා අපිට තීන්දුවක් දෙන්න කියලා. උසාවියෙන් දීපු තීන්දුව, මැනපු වාර්ථා තියෙනවානේ. උසාවියෙන් කියයි කරන්න ඕන මොකක්ද කියලා. මේක මහා ලොකු දෙයක් නෙමෙයි. බය වෙන්න දෙයක් නෑ. උසාවියෙන් ඇවිත් මැනල දීපු ඉඩමනේ. මේක මේ මාසේ කරගන්න බැරි වුනොත් අපිට ඒ පාර හදාගන්න හම්බවෙන්නේ නෑ. ඒ පාර හදන්න ලක්ෂ 20 ක් විතර යනවා. ඒ පාරේ බයිසිලකයකටවත් යන්න බෑ. මේ වගේ දේවල් වලට ඉක්මනට තීන්දු තීරණ ගන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාඃ-** සභාපතිතුමා අනතුරුදායක ගස් සම්බන්ධව තමයි අපි විශාල වශයෙන් පිටිපස්සෙන් ඉන්නේ. මම මේ කියන්නේ අපේ තිස්ස මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ ප්‍රශ්නයක්. ඒක පෙත්සම්කාරක සභාවට යන තත්වයකට ගියා කියලා ආරංචියකුත් තියෙනවා.

ඊළගට අනිත් කාරණය තමයි පියසේන ඩයස් මහතා පැමිණිලි කරලා තියෙනවා අනතුරුදායක ගස් දෙකක් කපන්න කියලා. කඩේගාවට ගියත් කියනවා මේ ගස්දෙක කැපුවේ නෑ කියලා. හම්බවෙන හැම තැනදිම ඕක ගැන කතා වෙනවා. ඒක හින්දා ඒ ගැන අවධානය යොමු කරන්න. නැත්නම් සභාව වැඩක් නෑ කියලා නරක නාමය එනවමම තමයි. අපි හොඳ වැඩ සභාවෙන් කරනවා. නමුත් මේ වැඩ නොකරන කොට අපිට නරක නාමය එනවා අනික් පැත්තෙන්.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමාඃ** සන්සයිඩ් ගාර්ඩ්න් එකේ පාර හදලා තියෙනවා. ඒකේ කාණු පද්ධතියක් හදන්න පුළුවන් නම් ගොඩක් වටිනවා. මම වාසනා මන්ත්‍රීතුමියටත් කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගම්පෙරළිය වැඩ සටහන යටතේ බැරි වෙයිද දන්නේ නෑ. පාර නගින තැනට කම්බි බෝක්කුවක් දාන්න ඕන. දෙපැත්තේ කාණු දෙක කොන්ක්‍රීට් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමාඃ** පාරේ යන්න බැරි වෙනවා. පස් හෝදන් එන නිසා. ඒකට ඉක්මනින් පියවරක් ගන්න කියලා මම යෝජනා කරනවා.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-**සභාපතිතුමනි, කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ උඩින් යන සර්විස් වයර් එක ගිය සභාවේදි මම යෝජනා කරා විදුලි බල මණ්ඩලය දැනුවත් කරලා අල්ලපු කණුවට සම්බන්ධ කරලා දෙන්න කියලා. අදාළ දැනුම් දීම කරාද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක උපකාර්යාලයට යවලා තියෙනවා. දැනුම්දීම කරාවි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-**ඔබතුමා යෝජනාවක් ගෙනාවා නේද වක්වැල්ල ජල පවිත්‍රාගාරයෙන් බෝපෙ පෝද්දලට සාධාරණ පැය ප්‍රමාණයක් ජලය ලබා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද හැබැයි උදේ 9 ටත් ජලය ආවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-**සභාව තියෙන දවසට වතුර එනවා. අනිත් දවස් වලට එන්නේ නෑ. දින හතරක් වතුර ආවා. ආයේ නැවත ඒ ආකාරයෙන්ම වතුර කප්පාදුව සිදු වෙනවා. ඒක ඉක්මනට සොයා බලන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වතුර සම්බන්ධව තියෙන තත්වය මේකයි. දැනට දිගටම පැය 24 පුරා වතුර දෙන්න උත්සාහ දරනවා කිව්වා. ඒ ලෙවල් එක අඩු වුනාම කිව්වා එහෙම වෙන්නෙ. උපරිම උත්සාහ කරනවා කිව්වා. ඒ ලෙවල් එක අඩු උනොත් දවස් 2ක් විතර දෙන්න බෑ කිව්වා. උපරිම සතියට දවස් 5 ක් දෙන්න බලනවා කිව්වා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඊළග ප්‍රශ්නය තොටගොඩ, කුරුන්දකන්ද, කපුහෙම්පල අතුරු මාර්ග වල කසිප්පු ජාවාරම ජමරෙට යනවා. හැන්දෑවරුවට පාරේ යන්න බැරි තරමට පත්වෙලා තියෙනවා. ගිය සභාවේදී මම යෝජනා කරා අක්මීමණ පොලිස් ස්ථානාධිපතිතුමාව මේ ගැන දැනුවත් කරලා ලිපියක් යවන්න කියලා. ඒක යැව්වද කියලා දැන ගන්න ඕන. තොටගොඩ මදනායක මාවතේ සල්මල් උයන අසල, තොටගොඩ පන්සල පාරට හැරෙන ස්ථානය කුරුන්දකන්ද පාරට හැරෙන තැන කසිප්පු ජාවාරම කරනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ** කසිප්පු විතරක් නෙමෙයි දැන් තියෙන්නෙ!

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ** ඉස්කෝලේ යන්නෙ නැති ළමයින් 6 දෙනෙක් ඉන්නවා මගේ කොට්ඨාශයේ. ඒ ගැන සැලකිලිමත් වෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මන්ත්‍රීතුමිය අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ ඒකකයක් තියෙනවා ළමයි ඉස්කොලේ යන්නේ නැත්නම් පරීක්ෂණය කරන. ඒකට ඔය ළමයි ගැන දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ** දැනුවත් කරාම දෙම්ව්පියෝ විරුද්ධ වෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෙමව්පියන්ට විරුද්ධ වෙන්න බෑ. අවුරුදු 16ට අඩු ළමයි අනිවාර්යෙන්ම පාසල් යැවිය යුතුයි. දෙමව්පියන්ට විරුද්ධව නඩු දාන්න පුළුවන්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ** කුරුන්ද කන්ද සොහොන් භූමිය මැදින් පාරක් කපලා තියෙනවා. ඒක තමයි දැන් කසිප්පුකාරයන්ට , කුඩුකාරයන්ට තෝතැන්නක් වෙලා තියෙනනේ. එතැනට කසිප්පු වාහනය එනවා කියන්නේ රෑ එකොළහට දොළහට. ඒ පාරෙන් ගිහින් බහිනවා ෆිනෑන්ස් ඉඩමේ කාපට් පාරට. බැහැලා සුගුණ මාවතෙන් ගිහින් ලබුදූවට දාලා යනවා. කීප දෙනෙක්ම මට දුරකථන ඇමතුම් දුන්නා. ඒ සොහොන් පිටිය මැද පාරේ කාණුවක් කපලා හරි ගල් දාලා හරි පාර වහන්න කියලා ගිය සභාවේ මම යෝජනාවක් කරා. ඒක ක්‍රියාත්මක වුනෙත් නෑ. ඒ පාර නිසා මේ කටයුත්ත පහසු වෙලා තියෙනවා. ඉක්මනින් ඒ කාර්යය කරලා දෙන්න. ඒක කසිප්පුකාරයෝ කපා ගනිපු පාරක්. ෆිනෑන්ස් ඉඩම කරන කොට පිවිසුම් මාර්ගයක් විදියට කර ගත්තා. දැන් ඒක ස්ථාවර පාරක් වෙලා. ඒක සභාවෙන් නඩත්තු කරන පාරක්වත්, කිසිම කෙනෙක් පාවිච්චි කරන පාරක් වත් නෙමෙයි. එයාලගෙ පහසුව සදහා හදා ගනිපු පාරක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-**ඒක ගැන කාර්මික නිලධාරී යවලා බලලා කියන්නම්.

**ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා ඃ** හපුගල පාසල අසළ පාර කොන්ක්‍රීට් කරලා සකස් කරා. නමුත් දෙපැත්තේ අවධානම තවම තියෙනවා. මම ඒක කීප වතාවක් කතා කළා. මොකක්ද ඒකට කරන්න පුළුවන්. පස් ටිකක් කපලා හරි ගෙනත් දාන්න පුළුවන් නම් වටිනාවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට පස් ටිකක් කපලා ගෙනත් දාමු.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** කාසල්හිල්වත්තේ අනවසර තාප්ප ඉදිකරපු එකේ තත්වය මොකක්ද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන කාර්මික නිලධාරීතුමා නැවත දැනුවත් කරන්නම්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ** අර කුඩු ප්‍රශ්නය තියෙනවා ගොඩකන්ද අවටත්. පිං ළිද ගාවත් තියෙනවා. එගොඩහකනත්තේ සංස්කෘතික මධ්‍යස්ථානය අවටත් තියෙනවා. ඒ ගැන සභාවෙන් පියවරක් ගත්තා නම් ඇත්තටම හොඳයි. සම්බන්ධීකරණ කමිටුවේදිත් මම කතා කරා. පොලීසිය එක්කත් කතා කරා. කුඩු ගේන ඔස්තාර්ගේ ඉඳන් ඔක්කොම විස්තර දුන්නා. අද වෙනකම් ක්‍රියාත්මක වෙලා නෑ මේ සම්බන්ධව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට පුළුවන් සභාව විධියට පොලිසියට ලිපියකින් දැනුවත් කරන්න විතරයි. අදාළ තොරතුරු අපි ස්ථානාධිපතිතුමාට කියමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ** එහෙම වුනාම ඔත්තුව දුන්නෙ කවුද කියලා අනික් පැත්තට යනවා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රගති වාර්ථාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම.**

**1. පොදු ගෙවීම්**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 01. ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ 2018 වර්ෂයේ අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා මාස 9ක දුරකථන දීමනාව ගෙවීම රු. 9000/=යි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ** එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-**එම ගෙවීම ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 02. ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ 2018 වර්ෂයේ අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා මාස 9ක ඉන්ධන දීමනාව ගෙවීම රු. 24,000/=යි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ** එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-**එම ගෙවීම ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 03. ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනිල් බන්දුතිලක මැතිතුමාගේ 2018 වර්ෂයේ අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා මාස 9ක දුරකථන දීමනාව ගෙවීම රු. 9000/=යි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ** එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ගෙවීම ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 04. ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනිල් බන්දුතිලක මැතිතුමාගේ 2018 වර්ෂයේ අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා මාස 9ක ඉන්ධන දීමනාව ගෙවීම රු. 23,500/=යි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ** එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ගෙවීම ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා ඃ** අපිට පැන නැගුණු කරුණු කියන්න ඕන. දැන් මොවුන් ගිය සභාවෙත් අද සභාවෙත් කිව්වා සත පහක් වත් ගන්නේ නෑ කියලා. මුදලින් නේද දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :-ඒක වෙනත් ගිණුමකට යන්නේ. පක්ෂයේ ගිණුමකට යන්නේ.

**ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා** : මම හිතුවේ මුදලින් ගෙවනවා කියලා. අපි කරන්නේ මුදලින් අරන් සමාජ සේවයට යොදවන එකනේ.

**2. කර්මාන්ත ගෙවීම්** - නැත

**3. සේවක ණය ගෙවීම්** - නැත

III. ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** : 1. කරාපිටිය ගොඩකන්ද මාර්ගයේ වනිගසේකර මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීම. රු.250,000/=යි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** : එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** : එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

2. කරාපිටිය, පන්විලදූවවත්ත, දයාරත්න මහතාගේ නිවස අසළ පැති කාණුව ඉදි කිරීම. රු.555,000/=යි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** : එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** : එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

3. මුලන, ගුණතිලක මහතාගේ කඩේ ඉදිරිපිට නො. 126 නිවස අසළින් ඇති මාර්ගය සංවර්ධනය කිරීම. රු.200,000/=යි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** : එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** : එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

**IV. මිල ගණන් කැඳවීම.**- නැත

**5. ලිපි ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** : 1. රියදුරන්ගේ බර යන්ත්‍ර ක්‍රියාකරුගේ හා මුරකරුවන්ගේ 2019 වර්ෂයට අදාළ නිලඇඳුම් දීමනාව ලබා දීම.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** :-එම ඉල්ලීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** : එම ඉල්ලීම ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා** : සභාපතිතුමා වැඩ ක්ෂේත්‍ර කම්කරු අයටත් නිල ඇඳුම ලබා දෙනවාද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** : ඒක නෑ.

**ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා** : එයාලා ස්ථිර සේවකයෝ නේද? චක්‍රලේඛ ආවාම සභාවෙන් අනුමත කරනවාද ගෙවීම් කරන්න. ස්ථිර තනතුරකට ඇතුළත් වුනාම ඒක නිල වශයෙන් ලැබෙනවා. සභාවට යෝජනාවක් විධියට ඇවිත් සභාවේ අනුමැතිය ගන්න ඕනද ඕකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ** වාර්ෂිකව ගෙවීම් කරන්න කලින් සභාවේ අනුමැතියට දානවා.

2. ඕපාත හග්ගොඩදූව මාර්ගයේ පිවිසුම් කොටස සංවර්ධනය කිරීමේ කර්මාන්තය

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ** ඒ සංවර්ධන ක්‍රියාවලිය දැන් සිදු කරගෙන යනවා. ඒක අඩු ඇස්තමේන්තු මුදලක් යටතේ තමයි වැඩ ආරම්භ කළේ. නමුත් කොරි පස් දාන ප්‍රමාණය වැඩි වුනා. ඒ නිසා අළුත් ඇස්තමේන්තුවක් දාලා සභාවේ අනුමැතිය ගත්තා. ඒ නිසා පැරණි ගිවිසුම් අවලංගු කරලා අළුත් ඇස්තමේන්තුවට අදාළව නව ගිවිසුමකට එළඹිලා මේ වැඩේ කරන්න සභාවේ අනුමැතිය දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

3. වරිපනම් අංක 113/4හි (බද්දේගම පාර වම) වරිපනම් බදු මුදල් ගෙවීමට හැකියාවක් නැති බව සනාථ කිරීම. (කාංචනා පණ්ඩිතරත්න මිය, බෝ.පෝ.ප්‍රා.ස. ආදායම් පරීක්ෂක)

එකී ලිපිය අනුව උළුවිටිකේ වැවේ වත්ත අංක 113/4හි ලිපිනයෙහි පදිංචි බී.කේ. ලියනගේ මෙනෙවියගෙන් අප ප්‍රදේශිය සභාවට අයවිය යුතු හිග වරිපනම් මුදල වන රු.5451.96/= ක මුදල ගෙවීමට හැකියාවක් නොමැති බවට 127/C බොකරගොඩමුල්ලවත්ත ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාමනිලධාරීතුමන් හා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරී විසින් තහවුරු කරලා තියෙන හින්දා දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව මෙම හිග වරිපනම් බදු මුදල් පොත් වලින් කපා ඉවත් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(උෟ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා.** - නැත.

මීළඟ මහා සභා රැස්වීම 2019.03.19 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකොන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.